ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 අප්‍රේල් 12 වන බදාදා
3 කාණ්ඩය 19 කලාපය
මිල රු. 80 යි




විශේෂ අතිරේකයක් නොමිලේ

## පරලොව ඉඳන් සිංහල අවුරුද්දට නෑගම් එන කැවුම් ආච්චී

## හතර දෙනක් දූෂණය කර මරා දැමූ හෝකන්දර මිනීමරුවන් කොටුවුනු හැටි

## නොනගතේ කියලා එකක් නෑ පුතේ

මහාචාර්ය අත්තනායක එම්. හේරත්

ශලිනි රණසිංහ

චානක පන්නිල

ඡායාරූප
දේවා ජයවර්ධන



# සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර

### නව සඳ බැලීම

අභිනව චන්ද්‍ර වර්ෂය සඳහා මාර්තු මස 23 වැනි බ්‍රහස්පතින්දා දින ද, අභිනව සූර්ය වර්ෂය සඳහා අප්‍රේල් මස 23 වැනි ඉරිදා දින නව සඳ බැලීම මැනවි.

### පරණ අවුරුද්ද සඳහා ස්නානය

අප්‍රේල් මස 12 වැනි බදාදා දින කොහොඹපත් යුෂ මිශ්‍ර නානු ගා ස්නානය කොට ඉෂ්ට දේවතා අනුස්මරණයෙහි යෙදී වාසය මැනවි.

### අලුත් අවුරුදු උදාව

අප්‍රේල් මස 14 වැනි සිකුරාදා දින අපරභාග 02.59ට සිංහල අලුත් අවුරුද්ද උදාවෙයි.

### පුණ්‍ය කාලය

අප්‍රේල් මස 14 වැනි සිකුරාදා පූර්වභාග 08.35 සිට එදින අපරභාග 09.23 දක්වා පුණ්‍ය කාලය බැවින් අප්‍රේල් මස 14 වැනි සිකුරාදා පූර්වභාග 8.35ට පළමුව ආහාරපාන ගෙන සියලු වැඩ අත්හැර, ආගමික වතාවත්වල යෙදීමද පුණ්‍ය කාලයේ අපර කොටස එනම් අප්‍රේල් මස 14 වැනි සිකුරාදා අපරභාග 02.59 සිට අපරභාග 09.23 දක්වා පහත දැක්වෙන අයුරින් ආහාර පිසීම, වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය ආදී නැකත් චාරිත්‍ර විධි ඉටුකිරීම මැනවි.

### ආහාර පිසීම

අප්‍රේල් මස 14 වැනි සිකුරාදා අපරභාග 03.29ට විචිත්‍ර වර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා ලිප් බැඳ ගිනි මොළවා දීකිරි මිශ්‍ර කිරිබතක්ද තල සහ විලඳ මිශ්‍ර කැවිලි වර්ගයක්ද පිළියෙල කරගැනීම මැනවි.

### වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය

අප්‍රේල් මස 14 වැනි සිකුරාදා අපරභාග 05.05ට විචිත්‍ර වර්ණ පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා සියලු වැඩ අල්ලා ගනුදෙනුකොට ආහාර අනුභවය කිරීම මැනවි.

### හිසතෙල් ගෑම

අප්‍රේල් මස 16 වැනි ඉරිදා පූර්වභාග 09.41ට රතු සහ කහ මිශ්‍ර වර්ණ (තඹ පැහැති) වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා හිසට ඉඹුල්පත්ද පයට නුගපත්ද තබා ඉඹුල්පත් යුෂ මිශ්‍ර නානු හා තෙල් ගා ස්නානය කිරීම මැනවි.

### රැකිරක්ෂා සඳහා පිටත්ව යෑම

අප්‍රේල් මස 17 වැනි සඳුදා පූර්වභාග 06.28ට ශ්වේත වර්ණ හෙවත් සුදු පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී දීකිරි මිශ්‍ර කිරිබතක් හා කැවිලි වර්ගයක් අනුභව කර දකුණු දිශාව බලා පිටත්ව යෑම මැනවි.

### පැළ සිටුවීම

අප්‍රේල් මස 20 වැනි බ්‍රහස්පතින්දා පූර්වභාග 06.38ට රන්වන් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිශාව බලා පැළ සිටුවීම මැනවි.

# නොනගතේ කියලා එකක් නෑ පුතේ

"සුනක්ඛත්තං සුමංගලං
සුප්පභාතං සුවුට්ඨිතං
සුඛණෝ සුමුහුත්තෝ ච
සුයිට්ඨං බ්‍රහ්මචාරිසු"

මේ කියන්නේ බුද්ධ දේශනාවට අනුව වැඩක් පටන්ගන්න විශේෂ නැකතක්වත්, වැඩ අතහරින්නට නොනගතය කියා වේලාවක්වත් නැහැයි කියන එක. කොටින්ම කියනවා නම් නැකත්වලට අනුව පින්කම් සහ සුබ මංගලයයන් පැවැත්විය යුතු නැති බවත්, මංගලයයක් සහ සුබ කටයුත්තක් පවත්වනු ලබන වෙලාව නැකත් විදියට සැලකිය යුතු බවක්.

ඒ කාලේ අලුත් සහල් මංගලයය පවත්වනකොට ඔය කියන කරුණු අනුගමනය කළා කියලා වංශකතාවල සඳහන් වෙනවා. ඔය අලුත් සහල් මංගලය පවත්වන්නේ බක්මහට නෙළන අස්වැන්නේ මුල්ම කොටහ ජයසිරිමහ බෝධීන්වහන්සේට පූජා කරන්නනේ. මුලින්ම කරන්නේ ගමේ උදවිය තම තමන්ගේ කොටහා අරගෙන ගිහිල්ලා ගමේ රාලගේ මහමඩුවේ තැන්පත් කරන එකලු. ඊටපස්සේ ප්‍රාදේශීය කෝරාලවරු ඇවිල්ලා ඒවා හේවිසි, හොරණෑ, බෙර ගහලා ගැල් පෙරහරකින් තමයි ජයසිරිමහ බෝධීන්වහන්සේ වැඩ සිටින උඩමලුවට අරගෙන යනවා කියන්නේ. ඊටපස්සේ සඳුන් දරවලින් ලිප් මොලවලා කිරි උතුරවලා පරිත්‍රාණ ධර්ම දේශනාවක් එහෙම පවත්වලා ඊටත් පස්සේ තමයි රජතුමා මහා සංඝයා එක්ක එකතුවෙලා මහා පත්තරේට අලුත් සහල් පුරවන කටයුත්ත ඉටු කරලා තියෙන්නේ.

මුලින්ම දුරුතු මංගලයයක් විදියට සමරලා තියෙන මේ අලුත් සහල් මංගලයය පස්සේ කාලෙකදී බක්මහට පවත්වන්න පටන් අරන්. ඒ නිසා ඒ උදවිය මේ උත්සවය අලුත් අවුරුදු දවසට පවා සමරලා තියෙනවා. ඒත් වංශ කතාවල සඳහන් වෙන විදියට නම් ඔය කියන එකක්වත් අලුත් අවුරුදු නැකත් පත්තරේට අනුව කරලා නෑ. එතකොට නොනගතයේදීත් මේ දේවල් කරන්න ඇති කියලා අපිට හිතන්න පුළුවන්.

ඒකෙන් පැහැදිලි වෙන්නේ වදු රජගොල්ලෝ වගේම මග සඟරුවනත් නොනගතය කියන්නේ වැඩ අත්හැරිය යුතු වෙලාවක් විදියට පිළි අරගෙන නැහැයි කියන එක. ඒ වගේම නොනගතයේදී වැඩ කිරීමත්, යමක් පිළිගන්වන එකත් අසුබ නිමිත්තක් විදියට සලකලා නැහැ.

**'අනගත අගත මතුදිශ ශශය දිනෙ'**

ඔය තියෙන්නෙ ඒ කාලේ රජගොල්ලෝ මහා සංඝයාට ආරාම පිළියෙල කළාට පස්සේ සෙල්ලිපිවල සඳහන් කරන අනිවාර්යය පාලි පාඨයක්. ඔතැනදී 'අනගත' කියලා අදහස් කරලා තියෙන්නේ 'නැකත් ඇති හෝ නැති වෙලාව' කියන එකලු. ඊළඟට 'අගත' කියලා අදහස් වෙන්නේ 'පැමිණි' කියන එකලු. 'ශශය' කියලා අඳුන්වලා තියෙන්නේ 'මහා සංඝයා'ව. 'දිනේ' කියන එකෙන් අර්ථ දක්වලා තියෙන්නේ 'පූජා කරමි' කියන එක.

එතකොට මේ පාලි පාඨයේ තේරුම වෙන්නේ නැකතක් ඇතිව හෝ නැතුව තුන්කාලයේ වඩින ඕනෑම සංඝයා වහන්සේ නමකට ඒ සංඝාවාස කැපයි කියන එක.

ඒකෙනුත් පැහැදිලි වෙනවා වදු උදවිය වැඩ පටන්ගන්නවත් වැඩ අත්හරින්නවත් සුබ අසුබ විදියට නැකත් බලලා නැහැයි කියලා.

හැබැයි ඔය නොනගතය කියන්නේ මොකක්ද කියන එක අදටත් ගොඩක් උදවියට ප්‍රශ්නාර්ථයක්. බහුතරයක් නැකත්කරුවෝ කියන දෙයක් තමයි නොනගතයේදී සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට ගමන් කරන නිසා ඔය වෙලාවට නැකත් නැහැ කියලා. තවත් සමහරු කියනවා නොනගත වෙලාවේදී සූර්යයාගෙන් සුබ කිරණ නිකුත් වෙන්නේ නැති නිසා ඒ වෙලාවට නැත්තේ සුබ නැකතක් විතරයි කියලා.

නොනගතයේදී සියලුම වැඩ රාජකාරිවලින් බැහැර වෙලා පින්දහම් කිරීම යහපත් කියලයි තවත් සමහරු කියන්නේ.

ඔය හේතු කාරණා නිසා නොනගතය ගැන ටිකක් කතා කරන්න අපිට හිතුණා.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික මහාචාර්ය අත්තනායක එම් හේරත් මහතා ඒ ගැන කිව්වේ මේ විදියේ කතාවක්.

මෙහෙමයි. නොනගතය කියන්නේ අනිවාර්යයෙන්ම නොකා නොබී ඉන්න ඕන වෙලාවක්වත්, වැඩ නොකර ඉන්න ඕන වෙලාවක්වත් නෙවෙයි. නොනගතයේදී කෑවට අපායේ යන්නෙ නෑ. කිසිම පවක් පිරෙන්නෙත් නෑ. මොකද සිංහල අලුත් අවුරුද්ද කියන්නේ සම්පූර්ණයෙන්ම කෘෂි කාර්මික උත්සවයක්. ඒකේ ප්‍රධාන තැනක් ගන්නේ ගොයම් ටික කපලා අස්වැන්න ගෙට අරගෙන අලුත් සහල් මංගලයය පවත්වන එක. එතැනින් පස්සේ අපේ පැරණි උදවිය කළේ ගමේ පන්සලට ගිහිල්ලා හොයිඳුල් සහල් ටික පූජා කරන එක. ඒකට අපි ගොයම් සංස්කෘතිය කියලත් කිව්වා.

වදු ඇත්තෝ ඕකට සූර්ය මංගලයය කියලා කිව්වෙත් ඉර මුදුන් වෙන බක්මහට කරපු නිසා. ඊටපස්සේ සූර්යයාගේ සංක්‍රාන්ති කාලයට නොනගතය කියලා අලුත් නැකතකුත් හදගත්තා. එහෙම කළේ මුළු අවුරුද්ද පුරාවටම වෙහෙස මහන්සි වෙන ඒ අයට විවේකයක් අවශ්‍ය නිසා මිසක් වෙන කාරණාවක් නිසා නෙවෙයි. ඒකනෙ අවුරුදු කාලෙට අවුරුදු උත්සව එහෙම පවත්වලා ටිකක් ලෞකිකව විනෝද වෙන්නේ. ඒ ඇරුණම මේක කොහෙත්ම ආගමික උත්සවයක් නෙවෙයි. අපි බෞද්ධ රටක් නිසයි නොනගතයෙදි එහෙමත් නැත්නම් පුණ්‍ය කාලයෙදි පින්දහම් කටයුතු කරන්නේ.

ඒ නිසා මේ දේවල් අපිට ලැබුණු විදිය ගැන කවුරුත් වාද කරගැනීම අනවශ්‍යයි. මොකද තවත් අවුරුදු සීයක් විතර යනකොට ඔය අවුරුදු නැකත් චාරිත්‍ර නැත්තටම නැතිවෙලා ගිහිල්ලා අවුරුදු කෑම මේසේ විතරක් ඉතුරුවෙයි. දැනටත් ඔය අලුත් අවුරුද්දට නව සඳ බැලීම, පරණ අවුරුද්දට ස්නානය කිරීම වැනි පැරණි චාරිත්‍ර නූතන සමාජයේ උදවිය අනුගමනය කරන්නේ නැති තරම්.

ඕකට මම හොඳ උදාහරණයක් කියන්නම්. ළඟකදී අපේ පළාතෙ මම දන්න කියන ඉලන්දාරියෙක් අලුත් මෝටර් රථයක් අරගෙන තිබුණා. ඉතින් දවසක්ද මේකා ජන්ඩි පහට ඇඳලා ඔහේ යනකොට කඩුගන්නාව හරියෙදි මට මුණගැහුනා. ඒ වෙලාවේ මම දැක්කා මේ කොල්ලා අර කාර් එක ඉස්සරහ දෙහි ගෙඩි තුනකුයි, මිරිස් කරල් දෙකකුයි එල්ලගෙන ඉන්නවා.

පස්සේ මම ඒ ගැන ඇහුවම කොල්ලා කිව්වේ එහෙම කළේ ඇස්වහ කටවහ දෝෂ දුරුවෙන්නය කියලා. එතකොට මම කොල්ලට පොඩි විහිළුවක් කරන්නත් හිතාගෙන කිව්වා "ඇයි පුතා අහල නැද්ද ඕකත් එක්ක තව පොල්බෑයකුත් එල්ලුවා නම් ගොඩක් සුබයි කියලා?" ඒ කිව්වත් හරි මේකා එකපාරටම මගේ පැත්තට හැරිලා "ඒක ඇත්තද සර්?" කියලා පුදුමයෙන් වගේ ඇහුවා.

ඉතින් බලන්න දැන් මම ඒකාට ඕව් කිව්වා නම් ඌ පහුවදට කාර් එක ඉස්සරහා පොල්බෑයකුත් එල්ලගෙන පාරේ යයි. එතකොට ඕක දකින තවත් උන් තම තමන්ගේ වාහනවල පොල්බෑයවල් ගහගෙන යන්න පටන්ගනී. අන්තිමේදී ඒක හැදුන හැටි ගැන ඔය කවුරුවත් දන්නෙ නෑ. අනික ඔය දෙහි ගෙඩියටයි මිරිස් කරලටයි ඔච්චර හරියක් කරන්න පුළුවන් නම් ජපනට ඔය වාහන එහෙන් මෙහෙට එවනකොටම ඒකත් කරලම එවන්න තිබුණානේ.



**ඉතින් බලන්න දැන් මම ඒකාට ඕව් කිව්වා නම් ඌ පහුවදාට කාර් එක ඉස්සරහා පොල්බෑයකුත් එල්ලගෙන පාරේ යයි. එතකොට ඕක දකින තවත් උන් තම තමන්ගේ වාහනවල පොල්බෑයවල් ගහගෙන යන්න පටන්ගනී. අන්තිමේදී ඒක හැදුන හැටි ගැන ඔය කවුරුවත් දන්නෙ නෑ**

හැබැයි ඉතින් දෙහි මිරිස් එල්ලුවාය කියලා කාටවත් හානියක් වෙන්නෙත් නෑ. ඒ නිසා අපි ඒ අයව විවේචනය කරන්න අවශ්‍යත් නෑ. ඉතින් ඔය කියන නොනගතය කියන්නෙත් අන්න ඒ වගේ දෙයක්.

කැමති කෙනෙකුට මේ චාරිත්‍ර වාරිත්‍ර ඉටු කරන්නත්, අකමැති කෙනෙකුට ඒවා නොකර ඉන්නත් නිදහස තියෙනවා. එහෙමයි කියලා ඒවා නොකරන උදවියගේ පවුල්වලට දෝෂ ඇතිවෙන්නෙවත්, අසුබ පෙරනිමිති පහලවෙන්නෙවත්, ගෙවල් මුසල වෙලා යනවා කියලා එකක්වත් නෑ.

මොකද බුද්ධ දේශනාවට අනුව සුබ කටයුත්තක් කරන වෙලාව නැකතක් විදියට සලකනවා ඇරෙන්න නැකත්වලට අනුව සුබ කටයුතු කරපු බවක් නොතැනකවත් සඳහන් වෙලා නෑ.

■ ලිහිණි මධුෂිකා

# පරලෝකෙ ඉඳන් සිංහල අවුරුද්දට නැගම් එන ‘කැවුම් ආච්චි’



මළවුන් ආරූඪ වන බව පැවසෙන පුද්ගලයන් පිළිබඳව අපි කොතෙකුත් අසා ඇත්තෙමු. එහෙත් සිංහල අලුත් අවුරුද්දට ඔන්න මෙන්න කියා තිබියදී පමණක් මියගිය වියපත් කාන්තාවක ආරූඪ වන තරුණියක පිළිබඳව මට මුල්වරට අසන්නට ලැබුණේ මීට දස වසරකට පමණ ඉහත පිළියන්දලදීය.

ඒ වසරේ අලුත් අවුරුද්ද එළැඹී දින කිහිපයකට පසුව මම පිළියන්දල ප්‍රදේශයේ හිතවතකුගේ නිවසේ පැවැත්වුණු අලුත් අවුරුදු සාදයකට සහභාගී වීමි.

“අපේ පැත්තෙ නම් දැන් දිගටම අවුරුද්දට තොවිල් නටන්න වෙන සිද්ධියක් වෙනවා. අවුරුද්දට දවස් කීපයක් තියෙද්දි ඒ පැත්තෙ ගෑනු කෙනෙකුට මැරිච්ච ආච්චි කෙනෙක් ආරූඪ වෙලා එකම ජංජාලයයි. කොහොමහරි අලුත් අවුරුද්දත් එක්කම යකැදුරෝ ගෙන්නලා තොවිලයක් නැටුවට පස්සේ තමයි ආරූඪය නැතිවෙන්නේ. පසුගිය දවස්වලත් එහෙම දෙයක් වුණා.” ඒ සුහද හමුවට එක්වී සිටි පිළියන්දල ප්‍රදේශයේම අයෙක් කීය. තමන්ට දෙවිවරුන්, යක්ෂයන්, ප්‍රේතයන්, කුම්භාණ්ඩයන් සේම මළවුන් ආරූඪ වූ බව පවසමින් අසාමාන්‍ය හැසිරීම් පළකරන සිය ගණනක් දෙනා සම්බන්ධ අත්දැකීම් මා සතුව තිබේ. එහෙත් සිංහල අලුත් අවුරුද්දට පමණක් මියගිය අයෙකු ආරූඪ වන කෙනෙකු පිළිබඳ අසන්නට ලැබීමේ යම් විශේෂත්වයක් ඇති බව මට හැඟුණි. ඒ අනුව එම සංසිද්ධිය පිළිබඳව වැඩිදුර විමසා බැලීමේ ආශාවක් සහ කුතුහලයක් මා තුළ පිබිදුණි.

“ඔය ආරූඪය සිංහල අලුත් අවුරුද්දට කිට්ටු වෙනකොට විතරක් වෙනවා නම් එකත් එකටම ඒකට විශේෂ හේතුවක් තියෙන්න ඕනේ. ඔය කියන ගෑනු ළමයයි, විශේෂයෙන් ඒ ළමයගේ පවුලේ අයයි කැමති නම් සුදුසු දවසක් වෙලාවක් යොදාගෙන ඒ ගැන හොයාබැලීමක් කරන්න මට පුළුවන්.” ඒ මොහොතේ ඊට ප්‍රතිචාර දක්වමින් මම කීවෙමි.

කෙසේ හෝ සිංහල අලුත් අවුරුදු උණුසුම පහවී සතියකට හමාරකට පසුව මට යළි පිළියන්දල බලා යන්නට සිදුවූයේ එම තරුණියගේ පවුලේ සාමාජිකයන් විසින් කරන ලද ඉල්ලීමකට අනුවය. එහිදී ඔවුන්ගේ පෞද්ගලිකත්වය අනාවරණය වන කිසිඳු තොරතුරක් කිසිම අයුරකින් ප්‍රසිද්ධ නොකිරීමට මම ඒ පවුලේ ඥාතීන්ට පොරොන්දු වීමි.

සිංහල අලුත් අවුරද්ද දින කිහිපයක් තිබියදී එක්වරම මියගිය වියපත් කාන්තාවක ආරූඪ වන බව පැවසෙන එම තරුණිය විසිඅට වියැති විවාහක තරුණියකි. කුලියාපිටිය ප්‍රදේශයේ ඉපදී හැදී වැඩුණු ඇය පිළියන්දල පදිංචියට පැමිණ තිබුණේ විවාහයෙන් පසුවය. එම නිවසේ ඇගේ සැමියාට අමතරව ඔහුගේ මව සොයුරියන් දෙදෙනෙක් සහ සොයුරෙක්ද සිටියහ. මහරගමට නිම් ඇඳුම් සැපයීම ජීවනෝපාය කරගත් සැමියාගේ පවුලේ සියලුදෙනා ඉතා කඩිසර කාර්යබහුල ජීවිත ගතකරන බවක් ඔවුන්ගේ නිවසේ වටපිටාව දුටු සැණින් මට වැටහිණ.

“සිංහල අලුත් අවුරුද්ද කිට්ටු වෙනකොට තමයි අපිට කීයක් හරි වැඩිපුර අතට ගන්න පුළුවන් වෙන්නේ. ඒ හින්දා කොහොමත් අවුරුද්ද කිට්ටු වෙනකොට අපිට හුස්මක් කටක් ගන්න බැරිවෙන්න වැඩ. ඒ අස්සේ තමයි මෙයාගේ ඇඟට ඔය ආරූඪය එන්නේ. ඒ වෙලාවට මෙයා කතා කරන්නේ අවුරුදු අසූවක අනූවක තරමක ගෑනු කෙනෙක් වගේ.” ඇගේ නැන්දණිය කීවාය. එහෙත් එම තරුණිය කීයේ තමන් එසේ ආරූඪ වන බවක් තමන්ට නොවැටහෙන අතර යම් ක්ලාන්ත ගතියක් සමඟ පියවි සිහිය අහිමි වන බවක් පමණක් දැනෙන බවකි.

ඒ අනුව තවදුරටත් ඇගෙන් කරුණු විමසීම තේරුමක් නොමැති බැවින් එසේ ආරූඪයට පත්වූ පසු ඇගේ හැසිරීම් පිළිබඳව පවුලේ සාමාජිකයන්ගෙන් වෙන වෙන් වශයෙන් කරුණු විමසා සිටියෙමි.

එමගින් මා හට වටහාගත හැකි කරුණු අතුරින් ඒ මියගිය කාන්තාව නපුරු ගතිගුණවලින් යුතු මැහැල්ලක බවත්, අප රටේ කාන්තාවන් බොහොමයක් කෙරෙහි දක්නට නොලැබෙන සුරුට්ටුවක් බීමේ පුරුද්දක් ඇය සතුව තිබූ බවත් මට දැනගත හැකි විය. ඒ එම තරුණිය ආරූඪ වූ පසු “මට සුරුට්ටු ඕනේ, සුරුට්ටු ගෙනත් දියව්” යනුවෙන් ඇය මොරදෙන බව ඒ පවුලේ සෙස්සන්ගෙන් පැවසුණු බැවිනි.

මම පසුව එම තරුණියගේ සැමියාගේ බාල නැගෙණිය පමණක් සමීපයේ තබා ගනිමින් එම ආරූඪයේ අතීත කතාව පිළිබඳව විමසන්නට පටන්ගතිමි.

“ඉස්සර අපේ ගමේ ගෙවල් ළඟ හිටියා තරමක් කට සැර නපුරු ආච්චි කෙනෙක්. එයාගේ මනුස්සයා මැරිලා, දූ දරුවොත් වෙනම පදිංචි වෙලා හිටියේ. එයා කිසිම හේතුවක් නැතුව අහල පහල එක්ක රණ්ඩු කරගන්නවා. එයා තමයි මම දන්න විදියට ඔහොම සුරුට්ටු බිව්වේ.” එම තරුණිය කියා සිටියාය.

“එතකොට ඒ ආච්චි ඔයාලත් එක්ක බරපතළ ප්‍රශ්නයක් ඇති කරගෙන තියෙනවා. මොකක්ද ඒ සිද්ධිය කියලා මට හරියටම කියන්න?” මම ඇගෙන් ඉල්ලා සිටියෙමි.

“ඒක වුණේ මම ලොකු ළමයෙක් වෙච්චි අලුතම වගේ. ඒ ආච්චිගේ වත්තේ තිබුණු ඇඹරැල්ලා ගහක ගෙඩි අඩුයි කියලා දවසක් ඒ ආච්චි අපේ ගේ ඉස්සරහට ඇවිත් අපිට අමු තිත්ත කතාවෙන් බැන්නා. අපේ තාත්තා කොළඹ කොම්පැණියක ඉලෙක්ට්‍රිකල් වැඩ කරපු නිසා හැමතිස්සෙම ගෙදර නැතත් එදා ගෙදර හිටියා. මේ ආච්චි අපිට කතා කරපු විදියට තාත්තට හොඳටම කේන්ති ගිහින් මිදුලට බැහැලා ගෙදර පලයන් කියලා ආච්චිව තල්ලු කළා. එතකොට ආච්චිගේ කකුල් පැටලිලා වැටුණා. ඒත් ආච්චි ආයිත් නැගිට්ටේ නෑ. පස්සේ තාත්තම එයාව ඉස්පිරිතාලෙට අරන් ගියා. ඒත් ඒ වෙනකොටත් ඒ ආච්චි මැරිලා. මරණයට හේතුව හෘදයාබාධයක් කියලයි ඉස්පිරිතාලෙන් කිව්වේ.” එම තරුණිය කීවාය.

“එතකොට කොහොමද ඒ ආච්චි ජීවත් වුණේ? මොනවද එයාගේ ආදායම් මාර්ග?” මම ඇසුවෙමි.

“ඒ ආච්චි කළේ ඔය අලුවා, කැවුම්, කොකිස් වගේ දේවල් හදාගෙන මීගමුව, කොච්චිකඩේ වගේ පළාත්වලට අරන් ගිහින් විකුණන එක.” එම තරුණිය කීවාය.

ඇගේ එම ප්‍රකාශය අනුව වියපත් කාන්තාවගේ අසල්වැසියන් වන මේ නිවෙසට ඒ වියපත් කාන්තාව කැවුම් කොකිස් බදින සුවඳ නිරන්තරව දැනෙන්නට ඇත. පසුව එම කාන්තාවගේ මරණයෙන් පසු තරුණියගේ මනස තුළ අවරෝධනය වූ ඒ සුවඳ නිසා මෙවැනි තත්ත්වයක් ඇතිවූ බවයි මගේ හැඟීම වූයේ. සාමාන්‍යයෙන් අලුත් අවුරුද්දක් ලබද්දී කැවුම් කොකිස් බැදෙන සුවඳ නිතර දැනෙන නිසා අවුරුදු කිට්ටු වෙද්දී ඇයට එම සිදුවීම ස්මරණය වනු ඇත. එසේම සිංහල අලුත් අවුරුද්දට පෙර එම නිවසේ ඇතිවන කාර්යබහුලත්වයත් ඒ නිසා ඇතිවන මානසික පීඩාවෙන් මිදෙනු පිණිසත් මෙම තරුණිය ඇයද නොදැනුවත්වම ඒ කැවුම් ආච්චිගේ පෞරුෂයට අවතීර්ණ වී ඇති බවයි මගේ වැටහීම.

**එයාගේ මනුස්සයා මැරිලා, දූ දරුවොත් වෙනම පදිංචි වෙලා හිටියේ. එයා තමයි මම දන්න විදියට ඔහොම සුරුට්ටු බිව්වේ**



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**


Bata
තෑගි දෙන්නත් බාටා
අලුත් වෙන්නත් බාටා
AVURUDU
SPECIAL OFFER
Sampath Bank
Debit / Credit Cards
up to 10 % OFF
03rd to 09th April
COMMERCIAL BANK
Debit / Credit Cards
up to 10 % OFF
06th to 13th April
SEYLAN BANK PLC
The bank with a heart
Debit / Credit Cards
up to 10 % OFF
03rd to 10th April
BANK OF CEYLON
BOC
Bankers to the Nation
Debit / Credit Cards
up to 20 % OFF
06th to 14th April
DFCC BANK
Keep Growing
Debit / Credit Cards
up to 20 % OFF
03rd to 10th April
UNION BANK
Debit / Credit Cards
up to 20 % OFF
08th to 14th April
PAN ASIA BANK
The Understanding Bank
Debit / Credit Cards
up to 10 % OFF
05th to 11th April
PEOPLE'S BANK
THE PULSE OF THE PEOPLE
Debit / Credit Cards
up to 20 % OFF
10th to 12th April

# කතා හදන පිරිමි සේරම බෝසත් ද?

විජය - මාලනී දෙන්නගෙන් කාටද වැඩිපුර කැමති?

**ඒක හරි මෝඩ ප්‍රශ්නයක්නේ...**

කොහොමද මෝඩ ප්‍රශ්නයක් වෙන්නෙ?

**විජේටද ගාමිණීටද කැමති කියලා ඇහුවනම් මට ඕකට උත්තර දෙන්න තිබුණා. නැත්තම් අහන්න තිබුණා මාලනීටද ස්වර්ණාටද වැඩිය කැමති කියලා. මොකද විජේවයි මාලනීවයි කම්පෙයාර් කරලා එක්කෙනෙකුට කැමතියි කියලා කියන්න අමාරුයි. හැබැයි දෙන්නා එකට රඟපාපු චිත්‍රපටවල නම් දෙන්නගෙන් දෙන්නටම මාර එළියක් ලැබිලා තියෙනවා.**

මොන පිස්සුද? එහෙම එකක් වෙලා නෑ.

**එහෙනම් මොකක්ද වෙලා තියෙන්නේ?**

ඔය සිනමා කර්මාන්තය ඇතුළෙ මාලනීගෙන් විජේ එළිය වුණා මිසක්, විජේ නිසා මාලනී බැබලුණා කියල එකක් වෙලා නෑ.

**දැන් ඔය කියන්න හදන්නේ විජේට මොකුත් බෑ, මාලනී නිසා තමයි විජේ 'මාර පොරක්' වුණේ කියලද?**

නෑ මං එහෙමම කියන්නෙ නෑ. හැබැයි නළුවෙක් විදියට ගත්තොත් ගාමිණී, විජේට වඩා 'පොරක්. ඒත් විජේට හිත ගියාට පස්සෙ මාලනී හැම ප්‍රොඩියුසර් කෙනෙක්ටම වගේ කිව්වලු විජය නැතුව රඟපාන්න බෑ, මීටපස්සෙ රඟපානව නම් ඒ විජයත් එක්ක විතරයි කියලා. ඊටපස්සෙ ගාමිණීට දෙන්න හිතාගෙන ඉඳපු සමහර ෆිල්ම් විජේට දෙන්න ප්‍රොඩියුසර්ලා හිත හදගත්තලු.

**ඒ කියන්නෙ ඒ කාලෙ චිත්‍රපට නිෂ්පාදකයෝ ලයිම් ලයිට් එකේ ඉඳපු මාලනීව හලන්න බැරිකමට ගාමිණීව හලලා විජේට තැන දුන්නා කියලද?**

ඔව්. ඒක තමයි වෙලා තියෙන්නේ.

කොහොමටත් ඔය 'හංසවිලක්' තිරගත වෙච්ච 80 දශකෙ මුල් කාලෙ චිත්‍රපට කර්මාන්තය බාගෙට මැරිලා තිබුණෙ. හැබැයි ඉතින් මේ කාලෙ රංජන් රාමනායක වගේ ඒ කාලේ හැම අවුරුද්දකම වසරේ ජනප්‍රිය නළුවා සම්මානය ගත්තේ විජේ.

මේකනේ... ඔය කාලෙ වෙනකොට ජාතිවාදයට විජේගෙ තිබුණු විරුද්ධත්වය නිසා විජේව වමේ ප්ලේස් කරලා තිබුණෙ මානවවාදියෙක් විදියට. හැබැයි දැන් කවුරුහරි ගිහින් මාලනීගෙන් ඇහුවොත් කියයි මිනිහා ඔය කියන තරම් මානවවාදියෙකුත් නෙවෙයි කියලා.

ඔය කාලෙ වෙනකොට ජාතිවාදයට විජේගෙ තිබුණු විරුද්ධත්වය නිසා විජේව වමේ ප්ලේස් කරලා තිබුණෙ මානවවාදියෙක් විදියට. හැබැයි දැන් කවුරුහරි ගිහින් මාලනීගෙන් ඇහුවොත් කියයි මිනිහා ඔය කියන තරම් මානවවාදියෙකුත් නෙවෙයි කියලා

**ඇයි විජේ එක වෙද්දි මාලනීව දෙකට දැම්ම නිසාද?**

විජේ විතරක් නෙවෙයි ගෑනුන්ගෙ පහනෙන් එළිය බලන කොයි මිනිහත් කරන්නෙ ඒ ටිකම තමයි. පහන කාගෙද බැබලෙන්නෙ කවුද කියන එක නෙවෙයි ප්‍රශ්නේ. කටක් ඇරලා ඒක කියන්න තරම් නිහතමානීකමක් නැති එක. ඔය කුහකකම වැඩිපුරම තියෙන්නෙ පිරිමින්ට. ගොඩක් පිරිමි කැමති නෑ තමන්ගෙ ගෑනි තමන්ට වඩා ස්මාර්ට් වෙනවට. තමන්ව පහුකරගෙන යනවට.

**ඒක මේ පොඩි ඉරිසියාවක්නෙ මිත්‍රයා. ඒක ගෑනු ගාවත් තියෙනවා.**

මං කතා කරන්න ඒ ඉරිසියාව ගැන නෙවෙයි. ඒක හරි අහිංසක එකක්නේ. තමන්ගෙ එකීව තමන්ට නැති වෙනවට කොයි මිනිහත් බයයි. හැබැයි ඒකෙ අන්තයටම ගිහින් කවුරුහරි පිරිමියෙක් නීති දාලා, හිරකරලා ගෑනියෙක්ගෙ ගමන නවත්තන්න හදනවා නම් ඒක ඒ මිනිහගේ පිරිමිකම ගැන දෙපාරක් හිතන්න වෙන කාරණාවක්.

එහෙම කියන එක වැරදියි. පිරිමි නීති දන්නෙ, හිර කරන්නෙ නැතිවෙයි කියන බයට මිසක් ද්වේශසහගතව ගමන නවත්තන අරමුණකින් නෙවෙයි.

ඔය සේරම බයිලා... ඕනම ගෙදරක, පිරිමියෙක්ට වඩා ගෑනියෙක්ගෙ පර්සනැලිටි එක හයිය වෙනකොට පිරිමි බය වෙනවා. එතකොට තමයි නීති දන්නේ. ඒ නීතිවලට යටත් වෙන්නේ නැති ගෑනු මෙල්ල කරන්න පිරිමි තව ක්‍රම සහ විධිත් පාවිච්චි කරනවා.

**ඒ මොනවද?**

කතාබහ කරන, එකට වැඩ කරන සියලුදෙනා අල්ලලා කතා හදන එක.

එතකොට ඉතින් අහන්න ඕන 'කතා හදන උන් සේරම බෝසත්ද..' කියලා තමයි.


බෝසත්ලා වගේ තමයි සමහර පිරිමි ගෑනුන්ට කතා හදන්නේ. මොකද අර මොන විදියෙන් බැරි වුණත් ඒ වගේ දේවල්වලින් ගෑනු මානසිකව වට්ටන්න පුළුවන් බව උන් දන්නවා. එහෙමත් කරලා බැරි වුණොත් ඊළඟට අරන් දීපු චොකලට් එකේ ඉඳලා කියවනවා.


**හැබැයි ඉතින් ඔය කරපු කියපු දේවල් ආපස්සට කියවන එක වැඩිපුරම කරන්නේ ගෑනු නේද?**

ගෑනු විතරක් නෙවෙයි, එහෙම කරන පිරිමිත් ඉන්නවා.

කවදාවත් පිරිමියෙක් ගෑනියෙක්ට දෙන්න ඕන ගෞරවය දුන්න කියලා, අගය කළා කියලා පිරිමිකම නැතිවෙන්නෙ නෑ. හැබැයි ඔය කරපුවා කියවන සහ අතන මෙතන කතා හදන පිරිමි ඉන්නවා නේද, එහෙම උන්දැලට පිරිමිකම කියන එක ආපහු සල්ලි දීලවත් ගන්න බෑ.

පුරා





පුදුම හිතෙන
රනින් පිරෙන
සියල් සපිරි
රන් අවුරුද්දක්
කැරට් 22
රන් මාල
රන් මිලට පමණයි
දිනපතා
රන් පුදුමයන්
සෑම මිලදී ගැනීමකටම
පුදුම හිතෙන
තිළිණයක්
කැරට් 22
රන් පෙන්ඩන්ට්
රන් මිලට පමණයි
කැරට් 22
රන් මාලය සමඟ
රන් පෙන්ඩනය
රු. 75,000 සිට
දියමන්ති
පෙන්ඩනයක්
රු.3000
මාසික
වාරිකයකට
කැරට් 22
රන් වළල්ලක්
රු.12,000
මාසික
වාරිකයකට
MALLIKA HEMACHANDRA
JEWELLERS
*කොන්දේසි අදාළ වේ.




ගම්පහ කළමනාකරණ හා උසස් වෘත්තීය අභ්‍යාස ආයතනයේ හිටපු
ජ්‍යෙෂ්ඨ ඉංග්‍රීසි භාෂා උපදේශක මෙහෙයවන
ඉංග්‍රීසි කතාකරලම පුරුදු කරවන
සංහිඳ
ගම්පහ නුදුරු බෙම්මුල්ලේ නවීන පහසුකම් වලින් සමන්විත
කඳබඹුවාව සණස උත්සවශාලාවේදී
ඔබේ ප්‍රදේශයේ පන්ති සඳහා අමතන්න
K.A.ප්‍රබුද්ධික
074 227 17 39
ප්‍රියංකර ගමගේ
077 110 1563

# කළු කෙල්ලේ ඔබ හරිම හැඩයි

සිංහල අලුත් අවුරුද්දට තව දවස් කීයද? ඔන්න දැන් ඉඳලම මාධ්‍යවලින් අවුරුදු කුමාරියෝ තෝරන්න පටන් අරන්. ගිය සතියේ දවසක ප්‍රසිද්ධ මාධ්‍ය ආයතනයක අවුරුදු කුමාරි තරඟයට ඉදිරිපත් වුණු යුවතියකගේ ෆොටෝ එකක් ෆේස්බුක් එකේ සෑහෙන්න වෛරල් වුණා. සමහරු මේ යුවතියට සමච්චල් කරලා පෝස්ට් හදලා. තව උදවිය අවලස්සන වචනවලින් ඇයව උපහාසයට ලක් කරලා.

දන්නවද එහෙම කරන්න හේතුව? සුදු හමක් තිබුණු තරඟකාරියෝ අතරේ හිටපු එකම කළු කෙල්ල වීම.

සොසිබිනී ටුන්සි, ටෝනී ඈන් වගේ කළු කෙල්ලන්ට සුද්දියො පාස් කරලා මිස් වර්ල්ඩ් වෙන්න පුළුවන් නම්, කළුපාට වාරිස් ඩයිරිට පොත් ලියලා ජනප්‍රිය වෙන්න හොඳනම්, ඔප්රා වින්ෆ්‍රිට ලෝකේ ජනප්‍රියම වැඩසටහන්වල නිවේදිකාව වෙන්න පුළුවන් නම් අපේ කළු කෙල්ලෙක්ට අවුරුදු කුමාරි තරඟෙකට ඉදිරිපත් වෙන්නවත් බැරි ඇයි? අර පෝස්ට් දැක්පුවහම මට ආපු ප්‍රශ්නේ ඒක.

ක්‍රි.ව. 40 ඉතියෝපියාවේ කන්කඩා කියලා රැජිනක් හිටියා. ලෝකේ කළුම සමක් තිබුණු රැජිනිය ඇයලු. රෝම අධිරාජ්‍ය ඉතියෝපියාව යටත් කරගන්න ආපු වෙලාවේ රෝමන්කාරයෝ පරාද කළේ ඔය රැජිනලු. ඉතින් අදටත් අප්‍රිකානු මිනිස්සු ඇයට ගෞරව කරනවා. ඇගේ සූරකම් ගැන කතා කරනවා. ඉතිහාසය මිනිස්සුන්ගේ පාට මතක තියාගන්නේ නෑ. මතක තියාගන්නේ ඒ අය සමාජයට කරපු වැඩ විතරයි.

සුදු ලස්සනයි... හිටු කියලා සුදු වෙන්න... තව සුදු වෙන්න මාධ්‍යවල වුණත් විසිහතර පැයේම ඇහෙන ඔය වගේ ප්‍රචාර නිසා අපේ මිනිස්සුන්ගේ ඔළු කුරුවල් වෙලා. මෑතකදි හමුවුණු වෛද්‍යවරියක් කිව්ව කතාවක් මතක් වුණා. ඇය සම පිළිබඳ වෛද්‍යවරියක්. ළඟකදි අම්මා කෙනෙක් ඇගේ ගැහැනු දරුවා එක්කලා ඇයව මුණගැහෙන්න ආවලු. ඒ දරුවට වයස අවුරුදු පහක් ඇතිලු. හැබැයි දරුවට තිබිලා තියෙන්නේ කළු සමක්. අර අම්මා වෛද්‍යවරිය ළඟට ඇවිත් තිබුණේ දරුවට සුදු වෙන්න බෙහෙතක් ඉල්ලගන්න කිව්වොත් ඔබ විශ්වාස කරනවද? සමහර අම්මලා දරුවන්ගේ මොළේ වර්ධනය ගැන හිතන්නේ නෑ, සුදු ළමයෙක් හදන්න දරුවා බඩේ ඉන්නකල් කැරට් කනවා. ඒ කාලත් බබා කළු වුණොත් සමාජෙට මූණදෙන්න ලැජ්ජයි. හමේ පාටින් දරුවන්ගේ ජීවිතවලට බලපෑමක් වෙන්න දෙන්න එපා කියන එක පළමුවෙන්ම අම්මලාගෙන් ඉල්ලනවා.

අතීතේ අප්‍රිකාවේ ජීවත්වෙච්ච මිනිස්සු සුදු සමක් තිබුණු අය තරම් රූපලාවණ්‍ය සත්කාර කරලා නැහැ. සොබාදහම ඒ අයගේ සම රැකගන්නවා කියලා ඔවුන් විශ්වාස කළා. ඇත්ත. ඔවුන් හිතුවා හරි. කළු මිනිස්සු සුදු අය තරම් රූපය ගැන කරදර වෙන්න ඕනේ නෑ. මොකද මෙලනින් එයාලව රැකගන්නවා.

ඒ මෙහෙමයි. මෙලනීන් කියන්නේ වර්ණකයක්. මෙලනීන් වැඩි වුණාම මිනිස්සු කළු වෙනවා. අඩු වුණාම සුදු වෙනවා. මනුස්සයෙක්ගේ ඇඟේ පිහිටන මෙලනින් ප්‍රමාණය තීරණය කරන්නේ ජානවලින්.



හැබැයි අව්ව සහිත රටක ජීවත්වෙනවා නම් ඉබේටම සමේ මෙලනින් හැදෙනවා. ඒ ඇයි දන්නවද?

ඉරඑළියේ තියෙන UV කිරණ අවශෝෂණය කරලා ඒවගෙන් සමට වෙන හානිය අවම කරන්න මෙලනින්වලට පුළුවන්. මේ හේතුව නිසාම තද කළු සමක් තියෙන අයට සුදු හමක් තියෙන අයට සාපේක්ෂව චර්ම පිළිකා හැදෙනවා අඩුයි. ලෝකේ අවම පිළිකා ප්‍රතිශත වාර්තා වෙන්නේ කළු ජාතිකයෝ ඉන්න රටවල. ඒ විතරක් නෙමෙයි මෙලනින් නිසා සමේ තදබව වැඩි වෙනවා. ඒ කියන්නේ කළු සම එල්ලා වැටෙන, වයසට යන සීඝ්‍රතාවය අඩුයි. ඉතින් තමන්ට සොබාදහමින් ලැබුණු මෙලනින් තෑග්ග රැකගන්න ඕනා ඇයි කියලා දැන්වත් තේරෙනවද?

ලස්සන වෙනවා කියන්නේ හම සුදු කරගන්න එකට නෙමේ. කළු සම වුණත් පැහැපත්ව නිරෝගීව තියාගන්න බැරිකමක් නැහැ. කළු සමට ගැළපෙන ස්වභාවික සත්කාර මොනවද, කළු කෙල්ලන්ට හොඳ විලාසිතා මොනවද කියලා මේ ලිපියේ තියෙනවා. ඉතින් අද මේ ලිපිය කළු කෙල්ලන්ට විතරයි!

ග්‍රීක් යෝගට් ටිකකට ලෙමෙන් යුෂයි මී පැණියි එකතු කරලා ගාන්න. ග්‍රීක් යෝගට් හොයාගන්න අමාරු වුණොත් රස නොයෙදූ යෝගට් ටිකක් ගන්න.

**අදටත් අප්‍රිකානු මිනිස්සු ඇයට ගෞරව කරනවා. ඇගේ සූරකම් ගැන කතා කරනවා. ඉතිහාසය මිනිස්සුන්ගේ පාට මතක තියාගන්නේ නෑ. මතක තියාගන්නේ ඒ අය සමාජයට කරපු වැඩ විතරයි**

ග්‍රීන් ටී එකක් උණුවතුරට දලා නිවෙන්න අරින්න. ග්‍රීන් ටී යුෂවලට දෙළුම් යුෂ ටිකක් එකතු කරලා සමේ ආලේප කරන්න. විනාඩි 20ක් විතර තියලා සෝදලා අරින්න.

මුරුංගා කියන්නේ කළු සමට කියාපු බේත. මුලින්ම අපි මුරුංගා තෙල් ටිකක් හදාගමු. මුරුංගා කොළ ටිකක් අරගෙන සෝදලා තෙතමාත්තු කරලා පොඩිවට කපාගන්න. කපාගත්තු මුරුංගා කොළවලට පොල්තෙල් කාලක් එකතු කරලා හොඳට මිශ්‍ර කරන්න. පස්සේ ඒක ඩබල් බොයිල් ක්‍රමේට රත් කරගන්න. මේ මුරුංගා තෙල් සමේ වගේම හිසේත් ආලේප කරන්න පුළුවන්.

මුරුංගා කොළ වේළලා ඒකට වේළපු නෙල්ලි ගෙඩි දෙකක් එහෙමත් දලා බ්ලෙන්ඩ් කරගන්න. ඊටපස්සේ මේ පවුඩර්වලට වතුර ටිකක් එකතු කරලා සමේ ගාන්න.

ෂියා බටර්, ටී ෆ්‍රී තෙල්, ආගන් තෙල්, රෝස්ෂිප් ජෙල්, කොහොඹ තෙල්, හයලුරොනික් ඇසිඩ් එහෙමත් කළු සමට හොඳයි.

ඇඳුම් තෝරනකොට සුදු, කාකි පාට, තද දම්, ජ්ලම්, රතු, අළු, ළා නිල්, තැඹිලි, රත්තරං, රෝස වගේ පාටවලින් ඇඳුම් තෝරගන්න පුළුවන් නම් සුදු කෙල්ලෝ කීයක් හිටියත් කළු කෙල්ලෝ කැපිලා පේනවා.

කළු, නේවි පාට, තද දුඹුරු, ළා කොළ වගේ පාටනම් කිසිම වෙලාවක අඳින්න එපා. කළු සමට කැපෙන්නේ රත්තරං පාට ආභරණ කියන එකත් කියන්න ඕනේ.

ලිප්ස්ටික් තෝරනකොට චොක්ලට් බ්‍රවුන්, බ්‍රෝන්ස්, දම්, රෝස රතු, කොපර්, දුඹුරු, මැජෙන්ටා වගේ වර්ණ හොඳයි.


කොණ්ඩේ පාට කරන්න ඉන්න කළු කෙල්ලන්ට ඇශ්ලි බ්ලොන්ඩ්, කෝපර්, ජෙට් බ්ලැක්, කැරමල් බ්‍රවුන්, දුඹුරු, වයලට්, හනී ඩීප් හයිලයිට්ස් වගේ වර්ණ ගැළපෙනවා

"දැන් කීපදෙනෙක්ම මගේ හම සුදු කරගන්න කිව්වා. ඒක නම් මම කවදාවත් කරන්නේ නැහැ. මේ පාට මට ආශිර්වාදයක්."

ලෝකේ කළුම නිරූපිකාව නයකීම් ගට්වෙච් මාධ්‍ය සාකච්ඡාවකදී කිව්ව කතාවක්. ඉතින් කවුරු කොහොම කිව්වත් නයකීම් වගේ උපතින්ම ලැබුණු ඒ ආශිර්වාදය ගැන ආඩම්බර වෙන්න කියන එකයි අපිත් කියන්නේ.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# හැංගිමුත්තම් කරන්නී ඈ අහිංසක ඇතින්නී





තොරතුරු
**මහාචාර් අශෝක දංගොල්ල**
**(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)**

රෝගීන්ට දෙස්තරලා දෙවිවරුන් හා සමාන වුවද අලි ලෙඩ්ඩුන්ට ඒ කතාව අදාළ නැත. අලි ලෙඩුන්ට අලි දෙස්තරලා පේන්නට බැරිය. ප්‍රතිකාර කිරීම් වළකාගැනීමට අලි දෙස්තරලා ඉදිරියේ රටේ නැති සෙල්ලම් දන අලි ඇතුන් ඕනෑතරම් ඇත. ප්‍රතිකාර මඟහරින්නට පශුවෛද්‍යවරුන්ගේ පසුපස පන්නා එන, පොලු මුගුරුවලින් පහර දෙන අලි ඇතුන්ගේ කතා අපි කොතෙකුත් අසා ඇත. එක අතකට දුක දන්නේ වණේ ඇති කෙනා මිස වෙන කවුරුන්ද? එනිසා වේදනාව දැනෙද්දී මේ සියල්ල තමන්ගේ මතු යහපත වෙනුවෙන් බව ඔවුන්ට සිහි නොවනවා විය හැකිය.

මහාචාර්ය අශෝක දංගොල්ලටද මෙවැනි අලි ලෙඩුන් ඕනෑතරම් හමු වී තිබේ. ඇතැම්විට ඉතාම අහිංසක අලි ලෙඩුන් ද ඔහුගෙන් ප්‍රතිකාර ලබා නැතුවා නොවේ. මේද ඔහුගේ මතක ගොන්නේ සැඟවුණු එවැනි රෝගියෙකු ගැන කතාවකි.

බෙන්තොට සංචාරක හෝටලයක විසූ ඇතින්නක් හදිසියේ රෝගී වූවාය. රෝග විනිශ්චය කර ඖෂධ නියම කිරීමට අලි හිමිකරු මහාචාර්ය දංගොල්ලට බාර දුන්නේය. රෝගී ඇතින්න සාමාන්‍යයෙන් හුරුව සිටියේ ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාරවලටයි. එනිසාම මහාචාර්ය දංගොල්ල ඈ කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය. ඇතින්නගේ මුඛය, දිව සහ තොල් සුදුමැලි වී තිබිණ. එය අනෙක් සතුන්ගේ කිනිතුලු උණට (tick fever) සමාන බව මහාචාර්ය දංගොල්ලට වැටහිණ. ඒ අනුව ඇතින්නගේ රුධිර පරීක්ෂාවක් කිරීමට ඔහු පියවර ගත්තේය. කිනිතුලු උණ බෝ කරන 'බැබේසියා' නම් පරපෝෂිතයා ඇතින්නට ආසාදනය වී ඇති බව ඉන් තහවුරු විය. ඒ අනුව අනෙක් සතුන්ට කිනිතුලු උණ වැළඳුණු විට භාවිත කරන ඖෂධ මහාචාර්ය දංගොල්ල පළමු වරට අලියෙකු වෙනුවෙන් යොදා ගත්තේය. සති දෙකක පමණ කාලයක් ඇයට ඖෂධ එන්නත් කිරීමට සිදුවිය.

වඩා හොඳ ප්‍රතිඵල වෙනුවෙන් ඇතැම් අවස්ථාවල බොහෝ දුක් විඳීමට සිදු වේ. මේ ඇතින්නටද එසේමය. එහෙන් රෝගී තත්ත්වය දරාගත යුතුය. පසින් අතට දෙස්තර මහත්තයාගේ කටු ඇනිල්ල විඳ ගැනීමට සිදු වේ. කෙතරම් වේදනාවක් දැනුණද බෙහෙත් කරන්නට එන වෙදට අරියාදු කිරීමේ සිතක් ඇයට කෙදිනකවත් පහළ වූයේ නැත. නමුත් තමන් හිසට තම අතමය සෙවණැල්ල කියා සිතා ඈ මේ බෙහෙත් උගුලෙන් ගැලවීමේ මගක් සෙව්වාය. දෙස්තර මහත්තයාගෙන් සැඟවීයාම ඇයට තිබූ එකම විකල්පයයි. එබැවින් මහාචාර්ය දංගොල්ල දුටු වහාම සැඟවීමට ඇතින්න පුරුදු වූවාය. ඒ සඳහා හරිහමන් තැනක්ද නැත. ඇයට පිහිටට සිටියේ පොල් ගසක් පමණි. මහාචාර්යවරයා නෙත ගැටුණු වහාම ඈ ඊට මුවා වූවාය. අහිංසක ඇතින්න ආවරණය කිරීමට පොල් ගස් ප්‍රමාණවත් නොවූ නිසාම ඇතින්නට සිය ඖෂධ මාත්‍රාව මග හැරීමට ඉඩක් නොලැබිණ.

හැංගිමුත්තම් ක්‍රීඩාව හේතුවෙන් මහාචාර්යවරයාගේ මතකයේ රැඳී සිටි මේ අහිංසක ඇතින්න කිනිතුලු උණෙන් සුව වුවද වසර කිහිපයකින් අසාධ්‍ය මළ බද්ධයකට ගොදුරු වූවාය. පාන්දර යාමයක ඇය පරීක්ෂා කළ මහාචාර්ය දංගොල්ලට පෙනී ගියේ ඇගේ ජීවිතය අවදානමක පවතින බවයි. ඒ බව හිමිකරුටද දැනුම් දුන් මහාචාර්යවරයා ඖෂධ ලබා දී පිටත් වූයේ පසු දින විශ්වවිද්‍යාලයට යා යුතුව තිබූ බැවිනි. එහෙත් රාත්‍රී 10ට පමණ අවිස්සාවේල්ල පසු කළ වහාම රියැදුරු පැවසුවේ තමාට ඉතා වෙහෙස බැවින් තවදුරටත් රථය ධාවනය කළ නොහැකි බවයි. ඔහු පසුපස අසුනට ගොස් නින්දට වැටුණු බැවින් මහාචාර්ය දංගොල්ල වාහනය පැදවීය. එහෙත් වැඩි දුරක් යාමට වූයේ නැත. හදිසි ඇමතුමකි. හැංගිමුත්තම් කරන්නී මියගිය බවට ආරංචිය ලැබිණ. ඉන් කම්පා වූ මහාචාර්ය දංගොල්ල නැවත බෙන්තොට බලා ගියේ පශ්චාත් මරණ පරීක්ෂණය කිරීමටයි. ඒ යන අතරතුර නින්දෙන් අවදි වූ රියැදුරාට වාහනය නැවත අනිත් පසට පැදවීමේ හේතුව තේරුම්ගැනීමට සැලකිය යුතු වේලාවක් ගතවිය. පශ්චාත් මරණ පරීක්ෂණයේදී මහාචාර්ය දංගොල්ලට දැඩි වේදනාවක් ඇතිවිය. ඒ රෝගී ඇතින්නගේ බඩවැල පුපුරා තිබෙනු දැකීම නිසාය. වේදනා ඉවසමින් කිසිවකුට හානි නොකරම ඈ යන්නට ගොසිනි.

■ රජනිකා ලියනගේ


## පොලී නැතුව සල්ලි බෙදන.... ලංකාවේ ලොකුම අවුරුදු තෑග්ග

අප්‍රේල් මාසයේ අවුරුදු කන්න
පොලී නැතුව රන් ණයක් ගන්න

සැඟවුනු ගාස්තු කිසිවක් නෑ
ඉහළම ආරක්ෂාව සමඟින්

මෙදා අවුරුද්දේ හදවතේ
ගණුදෙනුව

පොලිය 0%

" ඔබේ වටිනා රන් භාණ්ඩය උකස් කර
ලබා ගන්නා මුදල පමණක් නැවත ගෙවන්න "

Asia Asset Finance

රන් ණය ලොවේ පෙරළිකාර
පෙර ගමන්කරුවා
දැන්ම අමතන්න

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | මීගමුව | 0766 227 056 |
| හෝමාගම | 0778 330 346 | ගම්පහ | 0779 230 549 |
| පස්සර | 0772 700 002 | කළුතර | 0776 167 149 |
| කොටහේන | 0702 539 382 | හලාවත | 0779 256 191 |
| වැල්ලවත්ත | 0710 870 686 | මාතර | 0705 979 237 |
| ග්‍රෑන්ඩ්පාස් | 0742 379 739 | ගම්පොල | 0710 870 735 |
| මොරටුව | 0766 227 059 | නාවලපිටිය | 0710 870 706 |
| පානදුර | 0767 952 286 | හැටන් | 0778 790 372 |
| වෙන්නප්පුව | 0710 869 378 | කෑගල්ල | 0703 583 363 |
| ගාල්ල | 0705 979 274 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| කුරුණෑගල | 0766 227 061 | පුත්තලම | 0771 201 861 |
| දිගන | 0778 156 738 | මහියංගනය | 0771 201 862 |
| බේරුවල | 0740 920 356 | වත්තේගම | 0742 551 103 |
| මතුගම | 0771 201 860 | හපුතලේ | 0760 677 018 |
| මොණරාගල | 0771 201 852 | මාතලේ | 0702 539 389 |
| බදුල්ල | 0771 201 863 | තලවකැලේ | 0710 871 009 |
| කල්පිටිය | 0761 605 803 | රාගල | 0710 870 703 |
| කටුගස්තොට | 0779 476 206 | පූඩළුඔය | 0740 929 541 |
| නාඋල | 0763 226 230 | මස්කෙලිය | 0760 909 822 |
| කන්තලේ | 0742 572 585 | පුස්සැල්ලාව | 0742 531 360 |
| පොතුවිල් | 0771 201 855 | මට්ටක්කුලිය | 0742 127 665 |
| වැලිමඩ | 0778 764 751 | ඇලකන්ද | 0771 201 857 |
| බගවන්තලාව | 0742 588 267 | හාවඑළිය | 0773 394 209 |
| ආගරපතන | 0742 499 563 | | |

*කොන්දේසි අදාළයි

# රත්තරන් දුවේ



අත්තනායක එම්. හේරත්

රත්තරන් දුවේ

අප කවුරුත් ඉපදෙන්න ඉස්සර පනාමුරේ කියන ගම් පළාතේ එක්තරා විශ්මයජනක දෙයක් සිද්ධ වුණා. ඒ පළාතේ හිටියා පස්සේ කාලෙක කතානායක ධුරය හොබවපු වලව්කාර රදළයෙක්. මේ මනුස්සයා කරපු එක රාජකාරියක් තමයි පනාමුර කැලයට ගිහිල්ලා ඒකේ ඉන්න අලි අල්ලගෙන ඇවිල්ලා විකුණන එක. දුවලා කවුරුත් දන්නවා ඇති මඩුවන්වෙල වලව්ව ගැන. ඒ වලව්වේ මුදලියි මේ ඇතුන් අල්ලලා මරපු ෆ්‍රැන්සිස් මොළමුරේයි ලේ ඥාතියෝ.

ඉතින් මොළමුරේගේ මේ අලි ජාවාරම ජයට කෙරෙද්දී එක දවසක් කැලේ ඉන්න අලි රැනක් අල්ලගත්ත මොළමුරේගේ මැර හමුදාව ඒ අය සියල්ලම අල්ලලා පනාමුරේ අලි කඳවුරේ හිරකෙරුවා. මේ අලි රැලේ නායකයා වුණේ ඇත් රජෙක්. ඌ බලනකොට ඌ හැර ඔක්කොම අලි අතුරුදන්. ඌ රැය පුරා ඉව අල්ලමින් ඇත්කොටුව සොයාගෙන ආවා. ඇතුළේ හිර කරලා හිටපු අලි රැනට නැති හයියක් පනාමුරේට ආවා. ඒ රැලේ හිටපු උගේ ඇතින්නත් පැටවු ටිකත් බේරගෙන ඇත් රජා පිටව ගියා. මේ විශ්මයජනක පෙරළිය දැක සියල්ලන් කලබල වුණා. පුදුමත් වුණා. මේ අලි රජා සිටිනකල් අලි අල්ලන්න බැරි බව දැනගත් මොළමුරේ ඌ මරා දමන්නට අණ කළා. මොළමුරේගේ මැර හමුදාව අලියාව කෲර ලෙස මරා දැම්මා. එක අලියෙක් මරා දැමීමට විරෙහිව මුළු රටම ගිනි ගත්තා. කවි කොළකාරයෝ කවි ලිව්වා. පාර්ලිමේන්තුවේ පනතක් ආවා රජයට හැර කාටවත් අලි අල්ලන්න බැරි බව කියමින්. ඒ පනත ගෙනාවේ ඇන්.ඇම්.පෙරේරා. පනාමුරේ ඇත් රාජා ගැන අපූරු ගීත ලියැවෙන්න පටන්ගත්තා. ලංකාවේ හැමෝම හිතුවේ ඇතා 'මෛත්‍රී බෝධිසත්වයෝ' කියලයි. අදත් අපි හැමෝම ඒ ඇතාට ගරු කරන්නේ කරඬුව ගෙනගිය ඇතාවත් පරාද කරමින්.

ඉතින් දුවේ මේ කතාව මං දුවලට කියන්නේ අන්න ඒ වගේ තවත් බෝසත්වරියක් ගැන කියන්න. කුරුණෑගල මලියදේව බාලිකා විද්‍යාලයේ 'විහඟනා ආරියසිංහ' දුවට ඒ වෙද්දී වයස අවුරුදු 19යි. හදිසියේම මේ දුවට හිසේ අමාරුවක් හැදිලා තිබුණා. ඇයව පරීක්ෂා කරද්දී පෙනී ගිහිල්ලා තිබුණා ඇගේ මොළය මියගිහින් බව. ඒ දුවගේ අක්කා එම බාලිකාවෙම ඉගෙනීම ලබලා දැනට වයඹ විශ්වවිද්‍යාලයේ ඉගෙනගන්නවා. ඉතින් මේ රෝගය වැළඳෙන්න කලින් මේ දුව ඇගේ අක්කට කියලා තිබුණා තමන් මියගියහොත් ශරීරයේ සියලුම කොටස් දන්දෙනවා කියලා. ඒ වචන කියලා තිබුණේ මොනම අමාරුවක් දුවට තිබිලා නෙවෙයි. ඇගේ යටිසිත තුළ තිබිලා තියෙනවා මරණය හෙමිහිට ඇය අසළට එමින් සිටින බව.

ඉතින් ඇගේ පියතුමත් අම්මත් එකතු වෙලා ඇගේ ශාරීරික අවයව කොළඹ ජාතික රෝහලට දන් දුන්නා. ඒ දන්දුන් ශරීර කොටස් හත්දෙනෙකුට පමණ බද්ධ කරලා තිබුණා. ඇයට දන් දෙන්න නොලැබුණේ ඇගේ මොළය පමණයි. ඒත් ඒ මොළය අක්‍රිය වෙන්න පෙරම ඒ මොළය සියල්ල දන්දීමට තීරණය කරලා. අපේ බෝධිසත්වයන් ඇස්, ඉස්, මස්, ලේ, දන් දුන්නා වගේ මේ පුංචි විහඟනා දුවත් ශරීරයේ සියලුම බද්ධ කළ හැකි කොටස් දන් දුන්නා. ඉතින් දුවේ මේ බෝසත් දියණියගේ චරිතය මතු යම් දිනයක අපේ බෞද්ධ ආකල්පත් වෙනස් කරාවි.

ගැහැනුන්ට බුදු වෙන්න බැහැ කියලා විශ්වාසයක් අප අතර තියෙනවානේ. පන්සිය පනස් ජාතකේ එකම තැනකවත් ගෞතම බුදුහිමි ගැහැනු ආත්මයක ඉපදිලා නැහැ. ඒත් ගමේ මිනිස්සු එකතු වෙලා 'ඉතිබිසෝ ජාතකය' කියලා ජාතක කතාවක් හැදුවා. ඒ ජාතක කතාව පන්සිය පනස් ජාතක පොතේ නැහැ. ඒත් ඉතිබිසෝ ජාතක කතාව කියලා කවි පොතක් ලියැවෙනවා මහනුවර යුගයේදී. ඒ ජාතක කතාවේ හැටියට අපේ බුදුහිමි ලේනියක, ගිරවියක ලෙස ඉපදී සැමියෙකුගේ පැතුමක් නිසා පසුකලෙක ගෞතම බුදු වූ බවට ඉති කුමාරි කතාවේ කියැවෙනවා.

> 'ඉති කුමාරිගේ ආයුෂ කෙළවර වීලා
> දෙව්ලොව පිරිමි බව ලබලා ඉපදීලා
> දෙව් සැප ලබා දෙව් ලෝකෙන් චුතවීලා
> ඉපදුණී මිනිස් ලොව මිනිසත් බව ලබලා'

ඉති කුමාරිගේ කතාව ඇසුරෙන් මහනුවර ගම්පොල හීන් බණ්ඩාර කරුණාරත්න මහතා ලියූ 'සාරකවි අඩහැරය' පොතේ එතුමා ඉති කුමරියගේ කතාව නැවත ලියලා තිබුණා දුවේ. ගැහැනියක බුදු කරවන්න පන්සිය පනස් ජාතක පොතට බැරි වුණාට ගැමියෝ 551 වැනි ජාතකය කියලා අලුත් ජාතකයක් හැදුවා. පන්සිය පනස් ජාතක පොතේ අපේ බුදුහිමි තිරිසන් සතුන් බවට පත්කරා. ඒත් ගැහැනියක බවට පත්කරලා නැහැ. ඒ කියන්නේ දුවේ තිරිසන් සතෙකුටත් වැඩිය ගැහැනිය පහත් කියන එක අඟවන්නද කියලා මමනම් දන්නේ නෑ. කොහොම නමුත් මලියදේව බාලිකාවේ විහඟනා



## පනාමුරේ ඇත් රාජට වඩා වීරකමක් කරලයි විහඟනා දුව මියගියේ

ආරියසිංහ දුව, සාම්ප්‍රදායික බෝසත් චරිත ඉක්මවා ගියපු බෝසත්වරියක් කියලයි මට හිතෙන්නේ. මොකද හත්දෙනෙකුට ජීවිතය දීලයි ඇය ජීවිතයෙන් සමුගත්තේ. හරියට පනාමුරේ ඇත් රජා වගේ.

ඉතින් මගේ දුවලටත් මම කියන්නේ ජීවිතය කියන්නේ මහා පුදුම දෙයක්. සිංහල අවුරුද්ද කියන්නෙම දුවේ අලුත් වීමට. පැරණි සංකල්ප පුපුරවා හැරලා අලුත් දේ නිර්මාණය කිරීමට. ඒ හින්ද තමන්ගේ අධ්‍යාත්මික සහ කායික ශක්තිය යොදාගෙන ලෝකය අලුත් කරන්න, වෙනස් කරන්න, කණපිට හරවන්න මේ බක්මාසෙදිත් මගෙ දුවට අවස්ථාව ලැබෙන්න කියලා මං ප්‍රාර්ථනා කරනවා. පුංචි බෝසත් විහඟනා ආරියසිංහ දුව ඒ සඳහා අපට හොඳ අත්වැලක්.

පුංචි විහඟනාගේ මෑදු පාරිත්‍යාගශීලී බවට දුවේ ඇතුගලත් මොහොතක් සසල වුණා. ශක්‍ර දෙවියෝ කියලා කෙනෙක් ඉන්නවානම් හඳේ හාවගේ රූපේ මකලා හත්දෙනෙකුට පණ දුන්න විහඟනා දුවගේ රූපය හඳමඬල මත අඳියි කියලයි මම නම් කල්පනා කරන්නේ.

**පන්සිය පනස් ජාතක පොතේ අපේ බුදුහිමි තිරිසන් සතුන් බවට පත්කරා. ඒත් ගැහැනියක බවට පත්කරලා නැහැ. ඒ කියන්නේ දුවේ තිරිසන් සතෙකුටත් වැඩිය ගැහැනිය පහත් කියන එක අඟවන්නද කියලා මමනම් දන්නේ නෑ**

අත්තනායක එම්. හේරත්

## දුව ධරණී

සඳු දින උදයේ නෙතු සනහන අති රමණී
දියුණුවෙ මංවෙතට දින දින ළංවෙන්නී
බාධක හැඳින දිවි ගමනේ දුර යන්නී
මං ආදරෙයි මගෙ දියණිය ධරණී

ඔබ දියණියේ මට මගෙ ජීවිතය වගේ
පිටුවෙන් පිටුව ඔබගේ මෙහෙවරයි අගේ
කවියාගේ දුව පනිමින් කරන දගේ
සිහිවටවිටදි තුටු කඳුළැලි නෙතග නැගේ

බාධක මැදින් ගලනා ගඟ ලස්සනය
ගන අඳුරට පායන සඳ සුන්දරය
ගසක මුදුන් මුල සැමවිට සවිමත්ය
ධරණී දියණියේ නුඹ මිණි පහනක්ය

සිතක නැගෙන සිතිවිලි ගොනු කරන්නට
දිරියෙන් නැණෙන් දිවි මග සරි කරන්නට
රෝ දුක් නිවා හද සුවපත් කරන්නට
ඔබ දරනා දිරිය බැහැ නිම කරන්නට

සුපැතුම් ගෙනෙන්නෙමි ඉදිරියටම යන්න
කතරට වහින පොද වැස්සක් වී ඉන්න
මඬේ පිපුණ මානෙල් මල ඔබ වන්න
ධරණී දියණියේ දිගුකල් වැජඹෙන්න

**ප්‍රියානි ප්‍රදීපිකා ඩබ්.කේ**
**කැකණදුර**

## දකින තුරු අවට විමසුම් ඇසින්

තාවකාලික ලැගුම්හලක සිටිමින
හඹා යයි දින දින ආශා පසුපසම
තරඟයටම දිව යනෙන තරුණ කැළ
නොදනීද කිසි පුවත්
දිවිය කෙටි බවක් ගැන
බැඳෙමින් අසම්මතයන්ටම
ගැරහුම් ලබයි නිති සම්මතයන්
නෙත් බැඳී ඇත කඩතුරාවෙන්
දකින තුරු අවට විමසුම් ඇසින්

**ටී.නිපුනි සමෝද්‍යා වත්තේගම**
**බෙලිඅත්ත**

## හන්තානේ සිට



සරසවියට වරම් ලබා
නගිද්දි හන්තානෙ කන්ද
සරදම් කළා මට
දෛවයේ අනෝරා වැස්ස
ලිස්සාගෙන ඇවිත්
අනේ මං නැවතුණේ
මහවැලි ගඟ අසබඩ
කළුගල් වැඩපොළක

**ලීල් චන්ද්‍රසිරි**
**නෑගම්පහ**

# කවි යාය

## ජීවිත ගමන

වර්තමාන ජීවිතය අනාගතය සොයා යයි
අතීත කතා නිතර මා හට සිහිවෙයි
අමතක කරන්න බැරි මතක නම් බොහොමයි
සියල්ල හිත දරා ඉදිරි ගමනට සැරසෙයි

**දිල්ෂා සිතුමිණී**
**බිබිල මැදගම**

## සැඟවීම

ඔබයි අම්මා
ඔබයි ගැහැනිය
දිවිසටනෙ අද
වීර සෙබළිය
තවත් විටෙකදි
විශාඛා විය
තවත් විටෙකදි
අම්බපාලිය
සැඟව ඇත ඔබෙ
නොතිර කය තුළ

**රත්නසේකර**
**රූපසිංහ**
**කිතුල්ගල**

## කවි යාය

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.**

''කවි යාය''
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07 නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

ධරණී
**ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්**
අංක 91, විජේරාම මාවත, කොළඹ 07. දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය
0112 127204
දැන්වීම් අංශය
0112672601, 0112672603, 0761393811
ෆැක්ස් 0112 673 451






# හතරදෙනෙක් දූෂණය කර මරා දැමූ හෝකන්දර මිනීමරුවන් කොටුවුණේ කොහොමද?



**ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිලි මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිලි මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය. නීතිය නව්‍යකරණයට හෙතෙම සක්‍රියව දායක වූවෙකි. හෝකන්දර ඝාතනය මෙරට නීති ක්ෂේත්‍රයේ සංධිස්ථානයක් ලෙස සැලකෙයි. DNA තාක්ෂණය ශ්‍රී ලංකාවේදී පළමුවරට භාවිත කළ නඩුව එයයි. ඊට ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න සුවිශේෂ දායකත්වයක් දුන්නේය. ඒ සියලු අත්දැකීම් පාදක කරගනිමින් මේ ලිපිය රචනා වෙයි. මේ, එලෙස සැකසෙන ලිපි මාලාවක දසවැන්නයි.**

වර්ෂ 1999 පෙබරවාරි 10 වනදා තවත් දිනක් ඇරඹුණේ බොහෝදෙනෙකුට නව බලාපොරොත්තු ගෙන එමිනි. හෝකන්දර අමරගොඩ පාරේ පදිංචි පළාතේ වැදගත්කමක් ඉසිලූ ලලනදාස පවුලේ සාමාජිකයින්ටද එවැනි අපේක්ෂා තියෙන්නට ඇත. එම පවුලේ මෑණියන් වූ සිරියාවතී සහ වැඩිමහල් දියණිය චන්ද්‍රා කඩිමුඩියේ ලැහැස්ති වූයේ අධිකරණයට යාමටයි. ගමේ කිසිවකු සමඟ වැඩි ඇයි හොඳයියක් නොතිබුණද කිසිවකුට කිසිදු කරදරයක් නැතිව ජීවත් වූ ඔවුන්ට හිත් අමනාපකමක් වූයේ අමරදාසගේ පවුල සමඟ පමණි. අමරදාසගේ ඇතැම් ක්‍රියාවන්ට විරෝධය පළ කිරීම මත දෙපිරිස අතර ආරවුල් සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස අමරදාසලාගේ මැදිහත්වීම මත වූ පහරදීමකට අදාළ නඩුව එදිනද හෝමාගම අධිකරණයේ විභාගයට ගැනීමට නියමිත විය. මව සහ වැඩිමහල් දියණිය ඊට සහභාගි වීමට පිටත්ව ගියහ. නිවසේ ඉතිරි වූයේ පියා ලලනදාස සහ දෙවැනි දියණියයි. කෙසේ වෙතත් නඩු විභාගයට ඇතැම් විත්තිකරුවෝ සහභාගි නොවූහ. ඔවුන් වෙනත් සැලැස්මකට සැරසෙමින් සිටියාද?

## සතුන්ගේ අමුතු හැසිරීම්

පෙබරවාරි දසවනදා රාත්‍රියේ අමරගොඩ පාරේ පදිංචිකාරිනියකට දුරකතන ඇමතුමක් ලැබිණ. අසල්වැසි ලලනදාසලාගේ නිවසේ මොකද්දෝ අමුතු දෙයක් සිදුවන බව ඇගේ සිතට දැනිණ. රාත්‍රිය එළැඹී තිබුණද නිවසේ විදුලි පහන් දල්වා නැත. ලිහා දමා සිටි ගවයෝ යළි ගාල් කර නැති නිසාදෝ කෑ ගසති. බල්ලන්ගේ අමුතු බිරීමකි. එනිසාම සිතේ ඇති වූ භීතිය මත ඇය ඇමතුමට පිළිතුරු දුන්නේ නොසන්සුන්වය. ඇමතුම්කරුට එය දැනුණු බැවින් ඔහු ඒ ගැන විමසීය. එවිට ඇය සිය හිතට වදදෙන කරුණු ඔහුට පැවසුවාය. සියල්ල අසා සිටි හෙතෙම එම නිවසේ ලිපිනයද ඉල්ලාගෙන තලංගම පොලිසියට තත්ත්වය පිළිබඳ දැනුම් දුන්නේය. රාත්‍රී 11ට පමණ පොලිසියෙන් නිවසට පැමිණියේ ඒ අනුවයි.

## වී පෙට්ටියේ මළ සිරුරක්

පොලිස් නිලධාරියකු නිවසේ පසුපස දොරින් ඇතුළුව ආලෝකයක් දැල්වීය. එක්වරම දුටු දසුනින් ඔහු කම්පනය වන්නට ඇත. වී ගබඩා කිරීමට තිබූ පෙට්ටියක වාඩි වී සිටින ඉරියව්වෙන් වූයේ ලලනදාසගේ සිරුරයි. ඔහුගේ අත් පා බැඳ දමා තිබිණ. යාබද කොරිඩෝවක මවගේ සහ දියණියගේ සිරුරු හමුවූයේ කැපුම් තුවාල සමඟයි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරමින් සිටි දියණිය චිත්‍රාගේ සිරුර දොරක සොයිබයේ එල්ලා තිබියදී හමුවිය. බාල දියණිය නයනාගේ සිරුර වැසිකිළිය අසලදී සොයාගැනිණ. පවුලේ එකම පිරිමි දරුවා නිශ්ශංකගේ සිරුර සොයාගැනුනේ පාන්දර යාමයේදීය. ඒ නිවසේ සිට මීටර 30ක් පමණ දුරිනි. ඒ අසල රුධිරය සහ මඩ තැවරුණ කිතුල් පොල්ලකි. නිශ්ශංකගේ සිරුරට මදක් එපිටින් අමරදාස අසාධ්‍ය තත්ත්වයේ සිටියේය. පසුව ඔහුද මියගියේය. නිශ්ශංක ඔහු සමඟ පොර බදන්නට ඇතැයි මත පැවතියද අදටද එහි සැබෑ තත්ත්වය කිසිවකු නොදනී.

## ජනාකීර්ණ පෙදෙසකදී ජීවිත හයක් බිලිගත්තේ කවුරුන්ද?

ජනයා ගැවසෙන පෙදෙසක එකම පවුලේ සයදෙනෙකු පැය ගණනාවක් ඇතුළත එක පෙළට ඔවුන්ගේම නිවසේදී ඝාතනයට ලක්වීම විශ්වාස කිරීමට අසීරුය. අවට කිසිවකුට මේ ගැන ඉව වැටුණේ නැතිද? මෙතරම් සාහසික අපරාධයක් කළේ කවුරුන්ද? විමර්ශකයින් ඉදිරියේ ප්‍රශ්න වැලකි. අසල්වාසීන්ගෙන් යම් යම් තොරතුරු ලැබෙන්නට වුණේ ඒ අතරයි. අදාළ නිවසේ පැවති අස්වාභාවික තත්ත්වය, සතුන්ගේ කෑගැසීම් පමණක් නොව ලලනදාසලාගේ වත්ත පිටුපසින් ඇති වෙල්යාය මතින් ආ ගිය පිරිස් ගැනද තොරතුරු හෙළිවිය. ඒ අනුව තුන්දෙනෙකු පොලිස් අත්අඩංගුවට පත්වූ අතර අමරදාසගේ පුතා (තවමත් ඔහු ජීවතුන් අතර බැවින් කමල් යැයි හඳුන්වමු) සැඟව සිට පසුව පොලිසියට බාර විය.

## ජොන්ටි නිවැරදිව සාක්ෂි අල්ලා ගත්තාද?

පන්දු රැකීමෙහි අතිදක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයකු කමල්ගේ මිතුරු ලැයිස්තුවේ සිටියේය. ඔහුගේ දක්ෂතාව හේතුවෙන් ජොන්ටි යන අන්වර්ථ නාමය ලැබී තිබිණි. (ඔහුව ඉදිරියට හැඳින්වෙන්නේද අන්වර්ථ නමිනි) මේ මහා අපරාධය සිදු වූ ද ජොන්ටි ටවුමට වී සිටියේය. දහවල් දෙකෙන් පසුව ඔහුට එහිදී කමල් හමුවිය. ඔහුගේ ඉල්ලීම මත හෙතෙම වෙල්යාය මතින් ඇවිද ගොස් ලලනදාසලාගේ වත්තට ගොඩ වී නිවසට ගියේය. එසේ යනවිට මේ නිවසේ සිදුවන්නේ කුමක්දැයි තමා දැන නොසිටි බව ජොන්ටි කීවේය. ඒ ගමනේදී ඔහු ලලනදාස සහ නයනාගේ සිරුරු දුටුවේය. කමල්ට අමතරව නඩුවේ පළමු, දෙවන සහ තෙවන විත්තිකරුවන් වූ අමරදාස පවුලේ හිතවතුන් ලලනදාසගේ නිවසේ සිටි බව ඔහු එහිදී දුටුවේය. එම නිවසින් පිටව ගිය ජොන්ටි කමල්ගේ දැඩි පෙරැත්තය මත සවස 3.30ට පමණ නැවත ලලනදාසගේ නිවසට ගොස් තිබේ. එහිදී සිරියාවතී සහ චන්ද්‍රාගේ සිරුරු දැක ඇත.

## රංචු ගැසී ස්ත්‍රී දූෂණයට දඬුවම්

කමල් සමඟ නැවතත් ජොන්ටි එම නිවසට ගියේ සවස 6ට පමණය. එවිට ඔහු දුටුවේ චිත්‍රා නමැත්තිය ඇඳක ගැට ගසා ඇති අයුරුයි. පළමු, දෙවැනි සහ තෙවැනි විත්තිකරුවන් ඇය දූෂණය කරන අයුරුද ඔහු දැක ඇත. සිව්වැනි විත්තිකරු වූ කමල්ද ඇය දූෂණය කිරීමට සැරසුණද අමරදාස වත්තට ඇතුළු වූ බැවින් එය වැළකී ගිය බව ජොන්ටි පවසා තිබේ. මේ වනවිට 1995 දණ්ඩ නීති සංග්‍රහයට ගෙන එන ලද සංශෝධනයකින් රංචු ගැසී ස්ත්‍රී දූෂණය සහ ඊට ආධාර අනුබල දීම ප්‍රධාන වරදක් කොට තිබිණ. ඒ සඳහා දඬුවම බරපතළ වැඩ සහිත වසර විස්සක සිර දඬුවමකි. චූදිතයන් සිව්දෙනාම ඊට වරදකරුවන් වූ අතර උපරිම දඬුවම හිමිවිය. අභියාචනයේදී සමූහ දූෂණයකට සිව්වැනි විත්තිකරු සම්බන්ධ නොවූ බවට තර්ක කෙරුණද ආධාර අනුබල දීම යටතේ ඔහු වරදකරුවකු වන බව ශ්‍රේෂ්ඨාධිකරණය තහවුරු කළේය.

## ජොන්ටි අපරාධ සහායකයකුද? සාක්ෂිකරුවකුද?

මෙම සිදුවීම ඇසූ දුටු එකම තැනැත්තා වූ ජොන්ටි පැහැදිලිවම පැවසුවේ මේ අපරාධයේ කිසිදු අවස්ථාවකට තමා සම්බන්ධ නොවූ බවයි. එනිසා ඔහු අපරාධ සහායකයකු ලෙස නම් කිරීමට නොහැකිය. ඔහු හුදු සාක්ෂිකරුවකු බවට පමණක් පත් කිරීම අවදානම්සහගත වුවද නීතිපතිවරයා ඒ අභියෝගය බාරගත්තේය. ඒ අනුව ජොන්ටි පැමිණිල්ලේ සාක්ෂිකරුවකු බවට නම් කෙරිණ.

## එකම ඇසූ දුටු සාක්ෂිය රකින්නේ කෙසේද?

මේ මහා අපරාධය කෙරෙහි රටේම අවධානය යොමුවිය. ජනතා උද්යෝගය කෙතරම් වුවද සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමකින් තොරව අපරාධයක වරදකරුවන්ට දඬුවම් පැමිණවිය නොහැකිය. ජනප්‍රිය මතයට වඩා ඉඩ දිය යුත්තේ නිවැරදි ක්‍රමවේදයටයි. එහිදී මතු වූ ගැටලුව නම් එකම සාක්ෂිකරුවකු මත යැපී නඩුව විභාග කිරීමයි. එකල නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ අංශයේ ප්‍රධානියා වූයේ එවකට අතිරේක සොලිසිටර් ජනරාල් සී.ආර්.ද සිල්වාය. හෙතෙම විමර්ශනය භාර නිලධාරියා ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න වෙත යොමු කළේය.

## ශ්‍රී ලංකාවේදී DNA තාක්ෂණය පළමුවරට භාවිත කළ නඩුව එයයි

**"ඔක්කොම හරි සර්. සැකකාරයෝ අල්ලාගත්තා. දැන් නඩුව හරි."**

**"මොනවද තියෙන සාක්කි?"**

**"හොඳ පාපොච්චාරණයක් කළා අපිට. ඔක්කොම හරි."**

පොලිස් නිලධාරියාගේ ප්‍රකාශයට තමා පිළිතුරු දෙනවාට වඩා සුදුසුම පියවර කල්පනා කළ ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න සිය ප්‍රධානියා වූ සී.ආර්.ද සිල්වා වෙත ගියේය. විමර්ශකයින්ට ලුණු ඇඹුල් සහිතව වාග් සංග්‍රහයක් භුක්ති විඳීමට එහිදී අවස්ථාව හිමිවිය. පොලිසිය හමුවේ කරන පාපොච්චාරණයක් අධිකරණය ඉදිරියේ සාක්ෂියක් නොවේ. එනිසා පරිවේෂණීය සාක්ෂි, විද්‍යාත්මක සාක්ෂි ආදිය අවැසිය.

## ශ්‍රී ලංකාවට DNA තාක්ෂණය

හෝකන්දර ඝාතන සිදුවීම ගැන විශේෂයෙන් සොයා බලන ලෙස අතිරේක සොලිසිටර් ජනරාල්වරයා ජනාධිපති නීතීඥ සරත් ජයමාන්නට දැනුම් දුන්නේය. විමර්ශකයින් හෙළිකළ වැදගත් තොරතුරක් කෙරෙහි සරත් ජයමාන්නගේ අවධානය යොමු විය. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ සැකකරුවකුගේ ටීෂර්ටයේ රුධිරය තැවරී තිබිණ. එය මෙරට නීති ඉතිහාසයේ නව පරිච්ඡේදයකට අඩිතාලමක් දමනු ඇති බව ඔහුට හැඟිණ. එබැවින් එම ටී ෂර්ටය ප්‍රවේසම් සහගතව තබන ලෙස හෙතෙම විමර්ශකයින්ට දැනුම් දුන්නේය. පසුව ඔහු ගියේ නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ අංශ ප්‍රධානියා වෙතයි.



ආචාර්ය මායා ගුණසේකර

"සර්, දැන් ලෝකෙට DNA තාක්ෂණය හඳුන්වලා දීලා තියෙනවා. අර ටී ෂර්ට් එකේ තියෙන ලේ බොහෝදුරට මැරුණ හයදෙනාගෙන් කෙනෙකුගෙ වෙන්න ඇති. ඒ නිසා අපිට DNA තිබුණානං වටිනවා."

විද්‍යා විෂයට සම්බන්ධ උපාධියක්ද සහිත සිය දැනුම අනුව සරත් ජයමාන්න පැවසූ කරුණ කෙරෙහි එවකට අතිරේක සොලිසිටර් ජනරාල් සී. ආර්. ද සිල්වා විශ්වාසය තැබීය. ඒ අනුව ඊට සුදුසු පුද්ගලයින් සෙවීම ආරම්භ විය.

## මායාගේ සහාය හිමිවේද?

කොළඹ විශ්වවිද්‍යාලයේ සිටින අණුක ජීව විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් සහිත මායා ගුණසේකර නම් තැනැත්තියක ගැන තොරතුරු ඔවුනට දැනගැනීමට ලැබුණේ මේ අතරයි. ඇය තමන්ගේ පර්යේෂණවල නියැලෙමින් කටයුතු කරන නිහඬ චරිතයකි. ඇගේ සැමියා පෞද්ගලික සමාගමක අධ්‍යක්ෂවරයකු වන කොළඹ රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරූ අයෙකු බව හෙළිවිය. ඔහු තවත් රාජකීයයකු වන සී.ආර්. ද සිල්වාගේ මිතුරෙකි. ඒ මිතුරුකම මත ආචාර්ය මායා ගුණසේකර සමඟ සාකච්ඡා කළද ඇය ඉල්ලීම තරයේ ප්‍රතික්ෂේප කළාය. DNA තාක්ෂණය පිළිබඳ සිංහල භාෂාවෙන් පැහැදිලි කිරීමට අපොහොසත් වීම සහ අධිකරණ ක්‍රියාවලිය පිළිබඳ දැනීමක් නොතිබීම ඊට හේතුවයි. එහෙත් ඇගේ සේවය අත්‍යවශ්‍ය බැවින් නීතිපති දෙපාර්තමේන්තු පාර්ශවයෙන් තවත් යෝජනා ඉදිරිපත් කෙරිණ. අවසානයේ ඇය විසින් සරත් ජයමාන්නට DNA තාක්ෂණය පිළිබඳ ඉගැන්වීමටත්, ඒවා සිංහල භාෂාවෙන් ප්‍රකාශ කරන අයුරු සහ අධිකරණ ක්‍රියාවලිය පිළිබඳ සරත් ජයමාන්න විසින් ඇයට ඉගැන්වීමටත් එකඟතාවක් ඇති විය. ඒ අනුව පරීක්ෂා කිරීමේදී හෙළි වූයේ ටී ෂර්ටයේ තැවරී තිබූ රුධිරය චූදිතයින්ට අයත් නොවන බවයි. එනම් ඒවා මරණකරුවන්ට අයත් බවට තර්ක කළ හැකිය. DNA පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි අධිකරණය හමුවේ ඉදිරිපත් කෙරුණේ හිටපු ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් පාලිත ප්‍රනාන්දු විසිනි. කෙසේ වෙතත් වෙනත් දෝෂ මත සැකකරුවන් වරදකරුවන් කිරීමට DNA පිළිබඳ සාක්ෂිය භාවිත නොවූවද එදින තැබූ අඩිය පසුකාලීනව සුවිසල් මෙහෙයක් ඉටුකළේය. ආචාර්ය මායා ගුණසේකර පසුව ජීන්ටෙක් ආයතනය ස්ථාපිත කළ අතර එය ගැටලු විසඳීම සඳහා ලබාදුන් දායකත්වය මිල කළ නොහැකිය.

## අතුරුදන් වූ 'Celebration' ඇඟිලි සටහන්

හෝකන්දර සය පුද්ගල ඝාතනය සිදුවූ නිවසේ තිබී 'Celebration' නමැති බිස්කට් ටින් එකක් හමුවිය. එහි තිබූ ඇඟිලි සටහන් එක් විත්තිකරුවකු සමඟ සසැඳිණ. එහෙත් එය පොලිසිය විසින් බලහත්කාරයෙන් බිස්කට් ටින් එක සිය හිස මත තබා ලබා ගත් බවට ඔහු විත්ති කූඩුවේ සිට ප්‍රකාශයක් කළේය. එසේ වුවද ඇඟිලි සටහන් රටාව අනුව එසේ නොවන බව ඇඟිලි සටහන් විශේෂඥ සාක්ෂි මත තහවුරු විය. තවද අධිකරණයට ඉදිරිපත් කළ යුතු අවස්ථාවේදී බිස්කට් ටින් එක අතුරුදන්ව තිබිණ. එහිදී ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න තර්ක කළේ යම් හෙයකින් සීගිරි ගලේ සලකුණක් ඉදිරිපත් කිරීමට අවැසි වුවහොත් ගලේ කොටසක් කඩා රැගෙන එන්නේද යන්නයි. එනිසා නඩු විභාගයේදී බිස්කට් ටින් එක භෞතිකව ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය නැති බව පැමිණිල්ලේ මතය විය. කෙසේ වුවද වාසනාවකට අපරාධ ස්ථානයෙන් ලබාගත් ඡායාරූප ගොනුවේ බිස්කට් ටින් එක සහිත ඒවාද තිබූ බැවින් ඇඟිලි සටහන් පිළිබඳ සාක්ෂිවල වාසිය පැමිණිල්ලට හිමිවිය. එමෙන්ම පොලිසියට ලබාදුන් කටඋත්තර අනුව විත්තිකරුවන් සතුව තිබී රන් භාණ්ඩද සොයා ගැනිණ. ඒවා මරණකරුවන්ට අයත් බව තහවුරු විය. ඊට මරණකාරියකගේ පෙම්වතකුගේ සාක්ෂියක්ද උපකාරී විය.




විශ්වවිද්‍යාල තරුණිය දූෂණයට ලක් වූ කාමරයේ තිබී සොයාගත් සිගරැට් කොට, පෙට්ටිය සහ කොන්ඩමයක්ද සාක්ෂි ලෙස ඉදිරිපත් කෙරිණ. කමල් සහ ජොන්ටි එකට සිටි බව සහ කමල් අතේ සිගරැට් පැකට්ටුවක් තිබූ බවද හෝකන්දර සැලුන් එකක සිටි අයෙකු ලබා දුන් සාක්ෂියකින් තහවුරු විය. තවත් කීපදෙනෙකුම ජොන්ටි සහ කමල් එකට සිටි බව සහ පාපැදියකින් ගමන්ගත් බවටද සාක්ෂි දී තිබිණ. වැසිකිළිය අසල නයනාගේ සිරුර උඩුබැලි අතට වැටී තිබියදී දුටු බව ජොන්ටි පැවසීය. එහෙත් ඡායාරූපවල එම මෘත ශරීරය තිබුණේ පැත්ත හැරීය. අධිකරණ වෛද්‍ය සාක්ෂි අනුව හෙළිවූයේ ඇය ඝාතනය වූ පසු බොහෝ වේලාවක් සිරුර උඩුබැලි අතට තිබී ඇති බවයි. එය පැත්ත හරවා ඇත්තේ මහේස්ත්‍රාත් පරීක්ෂණය අතරතුරය. ඒ සෑම දෙයින්ම ජොන්ටිගේ ඇසු දුටු සාක්ෂිය සත්‍ය බව තහවුරු විය.

## මිතුරුකමට එල්ලුම්ගස්

ඉදිරිපත් වූ කරුණු සලකා බැලූ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල සිව්වන සැකකරු වූ කමල් හැර අනිත් තිදෙනා නිශ්ශංක හැර සෙසු පස්දෙනාගේ ඝාතන සඳහා වරදකරුවන් කොට මරණ දඬුවම නියම කළේය. ඔවුන් තිදෙනාට රන් භාණ්ඩ කොල්ල කෑම වෙනුවෙන්ද වසර 10 බැගින් දඬුවම් හිමිවිය. සමූහ ස්ත්‍රී දූෂණයට විත්තිකරුවෝ සිව්දෙනාම වරදකරුවන් වූහ. දඬුවම බරපතළ වැඩ සහිතව වසර 20කි. අභියාචනයේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ පංච පුද්ගල විනිසුරු මඩුල්ලද මෙම තීන්දුව එලෙසින්ම තහවුරු කළේය. අද කමල් සිය විසි වසරක සිර දඬුවම නිමා කර පැමිණ සිටී. මිතුරුකමට ඔහු සහ ඔහුගේ පියා සමඟ සම්බන්ධ වූවෝ තවම සිරබත් කති. කිසිඳු අපරාධයක් සදාකාලිකව සැඟවිය නොහැකිවා මෙන්ම තමන්ගේ හෘද සාක්ෂියෙන් කවදාවත් නිදොස් කොට නිදහස් විය නොහැකිය.

■ නීතිඥ රජනිකා ලියනගේ







# පෙරහරේ අලියෙක්ට ඇඳුමක් මහන්න ලැබෙන්න කියලා අපි බාරයකුත් වුණා

**ශලිනි රණසිංහ**

**සිංහල ක්‍රමේට අනුව සතියේ හැම දවසකටම අදාළ ග්‍රහයෙක් ඉන්නවා. ඒ ඒ ග්‍රහයට අදාළ වර්ණ තමයි සිංහල අවුරුද්දේ වර්ණය විදියට තෝරගන්නේ. මේ පාර අවුරුද්ද යෙදිලා තියෙන්නේ සිකුරාදාට. සිකුරාදාට අයත් ග්‍රහයා සිකුරා. සුදු, සුදුනීල, විචිත්‍ර කියන වර්ණ තුනම සිකුරුගෙ වර්ණලු. ඉතින් මේ පාර සිංහල අවුරුද්දට විචිත්‍ර වර්ණ අඳින්න ඕන කියලයි නැකැත් කමිටුව තීරණේ කරලා තියෙන්නේ. විචිත්‍ර වර්ණ කිව්ව හැටියේ අපේ ඔලුවට එන්නේ බතික්. ඉතින් මේක බතික් අවුරුද්දක් කියලත් සමහරු කියනවා.**

**බතික් කිව්වහම මතක් වුණේ ලංකාවේ බතික් රජා විපුල ධර්මවර්ධන මහත්තයව. විපුල කියන්නේ පූජාපිටිය පිටිසර ගමේ සෙරප්පු නැතිව ඉස්කෝලේ ගියපු කොල්ලෙක්. හිච්චි කාලේ ඉඳලා චිත්‍ර කර්මෙට හපනෙක්. උසස් අධ්‍යාපනය නොකළ විපුලගේ මුල්ම රස්සාව වුණේ සමූපකාරේ ඉන්ස්පැක්ටරකමක්. ඔහු රස්සාවෙන් හම්බෙච්චි පඩිය වියදම් කළේ නොයෙක් කලා ක්‍රම ඉගෙනගන්න. ඔය අතරේ ලංකාවට බතික් ගෙනාපු සෝමා උඩබාගෙ මහත්මියගෙන් විපුල බතික් ඉගෙනගත්තා. ඔය අතරේ ඔහුට රස්සාව නැතිවුණාලු. විපුල බතික් හදන්න පටන් අරන් තියෙන්නේ ඊටපස්සේ. හදපු බතික් පිටේ කරේ තියාගෙන කෝච්චිවල විකුණුවලු. වැඩේ පංකාදු නිසා විපුලගේ බතික් ගැන රාවේ කටින් කට යන්න වැඩි කාලයක් ගතවෙලා නෑ. 1967 මහනුවර දළදා පෙරහරේ මඟුල් කරඬුව ගෙනියාපු ඇතාට බතික් ඇඳුමක් අන්දලයි අන්තිමේ උන්දා නතර වුණේ. මාලිගාවේ කරඬුව ගෙනියපු ඇතෙක්ට මුලින්ම බතික් ඇන්දවීමේ ගෞරවය හිමිවෙන්නේ ඔහුට. මේ සිද්ධිය කොච්චර ප්‍රසිද්ධ වුණාද කියනවා නම් සිරිමාවෝ මැතිනි නොබැඳි ජාතීන්ගේ සමුළුවට අඳින්නත් විපුල ධර්මවර්ධනගෙන් බතික් සාරියක් මහගත්තලු. මැතිනි විපුලගේ සාරි ඒ කාලේ ඉන්දියාවේ අගමැතිනි ඉන්දිරා ගාන්ධිටත් තෑගි කරලා.**

**විපුල මහත්තයගෙන් පටන්ගත්තට මොකෝ මේ කතාව ඔහු ගැන නෙමෙයි. 1967 විපුලගෙන් පස්සේ පෙරහර ඇත්තුන්ට බතික් ඇන්දෙව්ව විශේෂ යුවලක් ගැන. මේ පාර අවුරුද්දේ පාට විචිත්‍ර වර්ණ ඇඳගෙන අද ‘ධරණී’ කවරය විචිත්‍රවත් කරන්නේ බාධක අභියෝග මැද පුංචිවට ව්‍යාපාරය පටන් අරන් අලි ඇතුන්ට බතික් අන්දවාපු ‘අපේ බතික්’ ව්‍යාපාරයේ නිර්මාතෘ යුවල ශලිනි රණසිංහ සහ චානක පන්නිලගේයි. මේ සුබ අවුරුදු කාලේ අනිත් අයට ආදර්ශ දෙන සුබ මිනිස්සු දකින එක කොහොමත් සුබයිනේ. මේ යුවලගේ සාර්ථකත්වයේ ගමන ගැන අපිත් එක්ක කතා කළේ ශලිනි.**

“මගේ ගම ඇතුල්කෝට්ටේ. මම උසස් පෙළට භාෂා ඉගෙනගත්තා. ඉගෙනගෙන ඉවරවෙලා ජයිකා ජපන් ව්‍යාපෘතිවල වැඩ කළා. චානකත් සංචාරක මාර්ගෝපදේශකවරයෙක් විදියට වැඩ කළා. පාස්කු ප්‍රහාරයෙන් අපි දෙන්නට රස්සා නැතිවුණා. ඉතින් අපි දෙන්නටම ගෙවල්වලට වෙලා ඉන්න වුණා. එතකොට අපි විවාහ වෙලත් නැහැ.”

ඒ වුණත් බතික් ව්‍යාපාරයක් පටන්ගන්නවාය කියලා මේ යුවලගේ හිතේ හාන්කවිසියකවත් අදහසක් තිබුණේ නැතිලු.

**“මගේ අප්පච්චි සෑහෙන කාලෙක ඉඳලා විදේශගගතවෙලයි ඉන්නේ. බතික්වලට අප්පච්චි හරිම කැමතියි. ලංකාවට ආවොත් රට ඉන්න යාළුවන්ට අරන් යන්නෙම බතික්. ලංකාවට ආපු වෙලාවක අප්පච්චි චානක එක්කත් බතික් ගැන කතා කර කර හිටියා. චානකගේ ආච්චියි, නැන්දයි බතික් ඉගෙනගෙන තියෙනවා කියලා එතැනදි චානක අප්පච්චිට කිව්වා. එතකොට අපිට ජොබ්ස් තිබුණෙත් නැහැ. ඉතින් නිකන් ඉන්න එකේ අපි දෙන්නටම බතික් ඉගෙනගන්න පුළුවන්නේ කියලා එවෙලේ අප්පච්චි යෝජනා කළා. මට චිත්‍ර අඳින්න බැහැ හැබැයි වර්ණ සංකලනය ගැන සහජ හැකියාවක් වගේ දෙයක් තියෙනවා. ඉතින් අප්පච්චිගේ ඉල්ලීමට අපි බතික් ඉගෙනන්න පටන්ගත්තා. චානකගේ ආච්චියි, නැන්දයි තමයි අපේ මුල් ගුරුවරු.”**



බතික් කියන්නේ අපේම කලාවක් නෙමෙයි. හැබැයි අපේ රටේ සංස්කෘතියට ආවේණික මෝස්තර සහ වර්ණ නිසා අපේ බතික් කලාව ලෝකය පුරා ප්‍රකටයි

“සාම්ප්‍රදායික ක්‍රම ඉගෙනගෙන ඒවා අපිටම ආවේණික විදියට හදන්න ගත්තා. ඉගෙනගත්තට පස්සේ පොකට් මනි හොයාගන්න කියලා බතික් ඇඳුම් කිහිපයක් නිර්මාණය කළා. මුලින්ම ඇඳුම් විකුණුවේ නෑදෑයන්ට, අඳුරන අයට. ඒ අයගෙන් ඇඳුම්වලට හොඳ ඉල්ලුමක් තිබුණා. ඒ ඇතිවුණු ඉල්ලුම එක්ක මේක වෘත්තියක් විදියට පටන්ගන්න අපි තීරණය කළා. මුල් කාලේ මටයි චානකටයි බතික් හදන්න එයාලගේ අම්මා, ආච්චි, නැන්දා හැමෝම වගේ උදව් කළා. හැමෝම එකතුවෙලා කරන වැඩක් නිසා ‘අපේ බතික්’ කියලා නම දමු කියලා යෝජනා කළේ මගේ අප්පච්චියි. පස්සේ ඒ නමින් අපි බිස්නස් එක රෙජිස්ටර් කළා.”

ඔය විදියට බතික් ව්‍යාපාරය පටන්ගත්තු ශලිනිලාට අලි ඇත්තුන්ට ඇඳුම් මහන්න අවස්ථාව ලැබුණු හැටි ඇය පැහැදිලි කළේ මෙහෙම.

“අපි දෙන්නා අලින්ට හරි කැමතියි. පෙරහර අලියෙක්ට අපෙ සල්ලිවලින් ඇඳුමක් මහන්න අවස්ථාවක් ලැබෙන්න කියලා 2020දී කෝට්ටේ පන්සලට බාරයක් ගැටගැහුවා. හිතුවත් වගේම 2021 ජනවාරි මාසෙදි නුවර තුන්වැනි කුඹල් පෙරහරේ මහ කරඬුව වඩම්මවන ඇත් රජාගෙයි, දෙපැත්තේ ඇත්තු දෙන්නගෙයි පෙරහර ඇඳුම් මහන්න අපිට අවස්ථාව ලැබුණා. අපිට ඒකට අවස්ථාව දුන්න ලහිරු අසංක අයියවත් මතක් කරන්න ඕනේ.”



# අපේ නම්වලින් ව්‍යාපාරය ලියාපදිංචි කරද්දි අපි විවාහ වෙලා හිටියෙත් නැහැ. හැබැයි මම තියපු ඒ විශ්වාසය ඔහු කිසිම වෙලාවක කඩකළේ නැහැ

ලෝකේ ලොකුම ඇඳුමක් නැත්නම් අලි ඇඳුමක් මහන එක ආවට ගියාට කරන්න පුළුවන් ලේසි පහසු වැඩක් නෙමෙයිනේ. ඒ අභියෝගය ජයගත්තු හැටිත් ශලිනි පැහැදිලි කළා.

**"නුවර පෙරහර කියන්නේ ලෝකයක් දකින අපේ සංස්කෘතික අංගයක්. ඒක ලොකු වගකීමක්. වැඩේ පටන්ගන්න කලින් නුවර මාලිගාවේ ඇවිදලා ඒ චිත්‍රවල මෝස්තර අරගෙන ඒ ගැන හොඳ හැදෑරීමක් කළා. පස්සේ එව්වා එක්ක සංකලනය කරලා අපිටම ආවේණික වෙනස්ම බතික් රටා හැදුවා.**

**අනික අලි ඇඳුම් තුනක් හදන එක ලේසි නැහැ. වැඩේට අපිට මාස දෙකක් විතර ගියා. පාන්දර 4 වෙනකල් නිදි මරාගෙන වැඩ කළා. අපිත් අලුතින්නේ වැඩේ පටන්ගත්තේ. ඒ නිසා රෙදි, ඩයි එහෙම ටිකක් නාස්ති වුණා. මට මතකයි එක අලි ඇඳුමකට දපු ඩයි ඇල්ලුවේ නැහැ. ඒ පාර ආයෙත් මුල ඉඳලාම ඒ වැඩේ කරන්න වුණා. අලි ඇඳුම් හදද්දි නන් අයුරින් අපිට උදව් කළ අයවත් මේ වෙලාවේ මතක් කරනවා."**

ඒ කොහොම වෙතත් අවසානෙදි හොඳ බතික් නිර්මාණ තුනක් පෙරහර ඇත්තුන්ට ලබාදෙන්න ඔවුන්ට පුළුවන් වුණාලු. දළදා මාලිගාවේ උදව්යටත් ඒ බතික් ඇඳුම් ගැන හරියටවත් පැහැදුනු බව ඇය කිව්වා.

"ඇත් ඇඳුම් නිර්මාණය කළාට පස්සේ 'අපේ බතික්' නිර්මාණවලට හොඳ ඉල්ලුමක් හැදුනා. අපි 2022 කෝට්ටේ පෙරහර ඇතුන් වෙනුවෙනුත් බතික් ඇඳුම් හැදුවා. 2022 දී දළදා මාලිගාවේ පහත මාලයේ තිරය නිර්මාණ කළා. අද වෙනකොට අපිත් එක්ක පස්දෙනෙක් වැඩ කරනවා. අපි ගොඩක්ම බාරගන්නේ ඔන්ලයින් ඕඩර්ස්. ඒ වගේම ජපානය, ඇමරිකාව, කැනඩාව, නවසීලන්තය, ඕස්ට්‍රේලියාව වගේ රටවලටත් බතික් ඇඳුම් අපනයනය කරනවා."

ව්‍යාපාරයේ සාර්ථකත්වයට සහාය දීපු ඇගේ පවුලේ උදව්ය, චානකගේ පවුලේ උදව්යට වගේම 'අපේ බතික්' ටීම් එකත් ඇය ආදරෙන් මතක් කළා. ව්‍යාපාරය පටන්ගත්තු මුල් කාලෙදි ජාතික ශිල්ප සභාවෙන් ඔවුන්ට විශාල සහායක් දුන්නලු.

**"අද කාලේ සම්බන්ධතා ඇතුළේ මිනිස්සුන්ව විශ්වාස කරන්න අමාරුයි. අපේ නම්වලින් ව්‍යාපාරය ලියාපදිංචි කරද්දි අපි විවාහ වෙලා හිටියෙත් නැහැ. හැබැයි මම තියපු ඒ විශ්වාසය ඔහු කිසිම වෙලාවක කඩකළේ නැහැ. ව්‍යාපාරයකින් නැත්නම් රස්සාවකින් උඩට යන්න අතහිත දෙන තමන්ට හයියක් වෙන සැමියෙක් තෝරගන්න කාන්තාවක් බුද්ධිමත් වෙන්න ඕනේ කියන එක තරුණියක් විදියට අනිත් තරුණියන්ට කියන්න කැමතියි."**

තමන්ගේ හිතට ආසාවක් ආවොත් මොන අභියෝග ආවත් ඒක නතර කරන්න එපා කියලත් ශලිනි කිව්වා. දෙයක් කරන්න පුළුවන් කියන විශ්වාසයට ඕනම කෙනෙක්ව ඕනම දුරක් එක්කරගෙන යන්න පුළුවන් කියන එකයි ඔබ වෙනුවෙන් ඇය දීපු පණිවිඩය.

අභියෝග මැද සාර්ථක වෙච්චි මේ වගේ මිනිස්සුන්ගේ කතා ආදර්ශයට අරගෙන පරණ රිදුම් අතීතයේම වැළලෙන්න ඉඩදීලා සාර්ථක හෙටක් වෙනුවෙන් අද ඉඳලාම මහන්සි වෙන්න කියන එකයි මේ සිංහල අලුත් අවුරුද්දේ අපිත් ඔබට කියන්නේ. ඉතින් ඔබ සැමට සුබම සුබ අලුත් අවුරුද්දක් වේවා!

■ **සෙව්වන්දි හෙට්ටිආරච්චි**

**ඡායාරූප - දේවා ජයවර්ධන**








# තව බබෙක් වැඩිවුණාට කමක් නැද්ද කියලා එදා දොස්තර මහත්තයා ඇහුවා

ලොකු දෝණිත්, චූටි දෝණිත්, සුදු දෝණිත් දැන් එකම පන්තියේය. අක්කලා දෙදෙනාටත් නංගීටත් මැදිව වාඩිවී සිටින්නේ සනූ මල්ලිය. එක ඉත්තක එකට පිපි මේ පුංචි මල් කැකුළු, අක්කලා මල්ලිලා වූයේ මිනිත්තුවක නැත්නම් තත්පර කිහිපයක වෙනසිනි. එලෙස සිව් නිවුන් දරුවන් ලෙසින් මෙලොව එළිය දුටු ඔවුන්, පසුගියදා මාවනැල්ල මයුරපාද ජාතික පාසලේ එක වසර පංතියට ඇතුළත් කෙරිණි. එකම පන්තියේ එක ළඟ වාඩිවී එකට අකුරු කරන්නට මේ සිව් නිවුන් දරුවන් වාසනාව ලැබුවේ පාසල් ඉතිහාසයටද අලුත් පිටුවක් එක්කරමිනි.

**"දරුවෝ හතරදෙනා ඉස්කෝලේ යන්න පටන් අරගෙන තවම දවස් කිහිපයයි. හැබැයි එයාලට ගෙදර ආවම කියන්න ඉස්කෝලේ සිද්ධි ගොඩයි. ඒ වගේම ගෙදර ඇවිත් කෑම කාලා, ඊළඟට හෝම්වර්ක් කරනවා. හතරදෙනා තරඟෙට තමයි ඒ වැඩත් කරන්නේ. ඉස්කෝලේ ගිය පළමු දවසේ පාන්දර හතරහමාරට මම එයාලව නැගිට්ටුවේ. එකපාරයි කතා කරන්න ඕන, නැගිටලා පේළියට දුවං එනවා. පුංචිම දවස්වල වගේ නෙවෙයි එයාලට දැන් තේරෙන නිසා, පුංචි පුංචි වැඩ තමන්ටම කරගන්න පුළුවන්. ඒ වගේම දැන් මම උදේට එයාලව ඇහැරවන්නේ නැහැ. ඉස්කෝලේ යන්න තියෙන කැමැත්ත කොච්චරද කියනවානං උදේ පහ වෙද්දි එයාලම නැගිටිනවා."**

ඒ මෙම සිව් නිවුන් දරුවන්ගේ මව එරන්දි ජයරත්නය. පුංචි පැටවුන් පහට අවදිවන නිසා එරන්දි හතරටවත් නැගිට දරුවන් වෙනුවෙන් කෑම පිසිය යුතුය. ඔවුන්ගේ කටයුතු සියල්ල සොයා බැලිය යුතුය. දරුවන් කුඩාම කාලයේත්, අදත් ඇය ඒ සියලු දේ කරන්නේ කිසිඳු මැසිවිල්ලක් නොනඟාමය. දියතලාව ගුවන් හමුදා කඳවුරේ සේවයේ නියුතු එච්.ඒ.ජී. සුමේධ ජයරත්න එරන්දිගේ සැමියායි. රාජකාරි කටයුතු හේතුවෙන් ඔහුට නිවසේ රැඳෙන්නට බැරි වුණත් එරන්දිට සියලු කටයුතු හොඳින් ඉටුකරගන්නට ධෛර්යය දෙන්නේ ඔහුය.

"අපේ ලොකු පුතා රශාන් කෝවිද දැන් අට වසර පන්තියේ. දෙවැනි පුතා තුෂාන් තේනුල හතර වසර පන්තියේ. අපිට පුතාලම දෙන්නෙක් හිටිය නිසා, ඊළඟට දුවෙක් තමයි ඕන වුණේ. ඒ වෙනකොට පොඩි පුතාට අවුරුද්දයි මාස අටයි. මට තුන් නිවුන් යාළුවෝ ඉන්නවා. ඒ වගේම හිතවත් අක්කා කෙනෙකුටත් තුන් නිවුන් බබාලා හිටියා. ඉතින් එයාලව දකිද්දි මට හැමදාම හිතිලා තියෙනවා මටත් ඒ වගේ නිවුන් බබාලා හිටියා නම් කියලා. කොහොමහරි පළමු ස්කෑන් එක කළාට පස්සේ, පේරාදෙණිය මහරෝහලේ නාරිවේද විශේෂඥ වෛද්‍ය සිසිර රණරාජා වෛද්‍යතුමා කිව්වා බබාලා තුන්දෙනෙක් ඉන්නවා කියලා. ඒ වෙලාවේ මට ලොකු සතුටක් දැනුණා. මහත්තයත් නිවාඩුවට ඇවිත් හිටිය නිසා එයත් මගේ ළඟ හිටියා. එයාගේ මූණෙත් ඒ සතුටමයි තිබුණේ. කොහොමහරි දෙවැනි ස්කෑන් එක මාස පහේදි විතර කළේ. ඒ වෙලාවෙත් දොස්තර මහත්තයා ඇහුවා කලින් බබාලා කීදෙනෙක් ඉන්නවද කියලා. අපි කිව්වා දෙන්නයි කියලා. ලැබෙන්න බබාලා කීදෙනෙක් ඉන්නවද කියලත් ඇහුවා. අපි කිව්වා තුන්දෙනයි කියලා. එතකොට දොස්තර මහත්තයා ඇහුවා තව එක බබෙක් වැඩි වුණාට කමක් නැද්ද කියලා. ඇත්තටම ඒ ස්කෑන් එකෙන් බබාලා හතරදෙනෙක්



කියලා කිව්වම සතුට වැඩිකමට ඒ වෙලාවේ ඇස්වලට කඳුළු ආවා."

**පළමු දවසේ පාන්දර හතරහමාරට මම එයාලව නැගිට්ටුවේ. දැන් එකපාරයි කතා කරන්න ඕන, නැගිටලා පේළියට දුවං එනවා**

ඔවුන් එදා ගෙදර ආවේ හිත සතුටින් පුරවාගෙනය. ස්කෑන් එකට දරුවන්ගේ ගැහැනු පිරිමි බව හරියටම නොපෙනුණත්, තමන්ට ලැබෙන්නට යන සිව් මිණිකැට ඇතුළු අනෙක් දෙදරුවන්ද මිණිකැට සේම රැක බලාගැනීම ඔවුනගේ අදිටන විය.

"දරුවෝ ඉපදිලා ගෙදර ගෙනාවම එයාලා ලොකු මහත් කරගන්න එක තමයි ඊළඟට ලොකුම හීනය වුණේ. අපිට ආදායම් මාර්ගයක් විදියට තිබුණේ මහත්තයාගේ වැටුප විතරයි. එයාට ගෙදර එන්න ලැබෙන්නෙත් මාසෙකට දෙකකට සැරයක්. ඉතින් බබාලා පුංචි කාලේ එයාලව බලාගන්න මගේ පුංචි අම්මා, මල්ලි වගේම මහත්තයගේ ලොකු අම්මගේ දුව උදව් කළා. ඒ වගේම අපි දෙන්නගෙම නෑදෑයෝ, බොහොම ලෙංගතු අසල්වැසියෝ, හිත මිතුරෝ අමතක කරන්න බැහැ. මට මතකයි ගමේ මුස්ලිම් සීයා කෙනෙක් බේබි සබන් කැටයක් අරගෙන බබාලා බලන්න ආවා. ඒ තෑග්ග පුංචි වුණාට ඒක ලොකු ආදරයක්. ඒ වගේම මේ වෙනකල් දරුවන්ට පොතකින්, පැන්සලකින්, සබන් කැටයකින් වගේම රුපියලකින් හරි උදව් උපකාර කළ හැමදෙනාටම බොහොම ස්තූතියි."

පුංචි දරුවන් හයදෙනෙකුත් සමඟ එරන්දිට පසු කරන්නට වූ කාලය ඉමිහිරි නැති බව ඇය කියන්නීය. කලක් ඇය මල්පෝච්චි හදා විකිණීම කළාය. මෙසේ මල්පෝච්චි හදන්නට ඇයට කියාදුන්නේ සැමියායි. ගෙවත්තේ කොළ පළා ටික, ඇතැම් එළවලු ඇයම වගා කරගත්තාය.

"අවශ්‍යතා වැඩි වුණත්, මම බොහොම අරපිරිමැස්සෙන් තමයි වියදම් කරන්නේ. මහත්තයා නිවාඩුවට ගෙදර ආවහම මම අරවට ණය වුණා, මේවට ණය වුණා කියලා කියන්න කැමති නැහැ. මොකද එතකොට එයාගේ හිතේ සැහැල්ලුවත් නැති වෙනවා. එහෙම නොවී ලැබෙන විදියට පිරිමහගන්න මම කැමතියි. ඒ වගේම තමයි දරුවෝ පාසලට යන දවසක් ගැන ලොකු හීනයක් හිතේ තිබුණා. එයාලා රටට වැඩදායී දරුවෝ කරන එක තමයි දැන් අපේ බලාපොරොත්තුව."



එරන්දි කියන්නේ ලොකු දෝණි දැනටමත් නංගිලා දෙදෙනා ගැනත් මල්ලී ගැනත් සොයා බලනා බවයි. මිනිත්තුවකට දෙකකට වැඩිමහල් වුවද ඒ අක්කලාගේ හැටිය. ඒ වගේම "අම්මට මහන්සියි නේද? මං පොල් ටික ගාලා දෙන්නද?" කියා අසන්නටත් සය හැවිරිදි ලොකු දෝණියට දැනුම් තේරුම් තිබේ.

**"එයාලා පුංචි වුණාට හතරදෙනාම මට ගෙදර වැඩවලට උදව් කරනවා. එයාලත් දැන්මම කෙනෙකුට උදව් කරන එක හොඳ දෙයක් කියලා දන්නවා. එක දුවෙක් කිව්වා පැන්සල අමතක වෙලා ආපු බබෙකුට ඉස්කෝලෙදි එයා පැන්සලක් දුන්නා කියලා. ඇත්තටම ඒ වගේ දේවල් ගැන සතුටුයි. දැනට පන්තියේ එක ළඟ තමයි මේ හතරදෙනා වාඩිවෙලා ඉන්නේ. හිටපු ගමන් නම් වෙනුවට ලොකු දෝණි, චූටි දෝණි කියලත් මෙයාලා කතා කර ගන්නවලු. ඒ වෙලාවට පන්තිභාර නෙරංජි මිස්ටත් මෙයාලව පැටලෙනවා කියලා මිස් කිව්වා."**

**මට ගෙදර වැඩවලටත් දැන් එයාලා උදව් කරනවා**

මේ දෝණිලා තුන්දෙනා ගෙදරදි එක පැත්තකය. සනූ මල්ලි ඒ වෙලාවට චූටි අයියා ළඟින් ඉන්නට කැමතිය. ඒ කෙසේ වුවත්, ඔවුන් හතරදෙනා හතරදෙනාට උදව් කරගන්නා අවස්ථා බොහෝය.

විටෙක දුෂ්කර වුවත් එරන්දිගේ සතුට මේ පුංචි පැටවුන් ලොකුවනු දැකීමය. ඔවුන්ගේ අනාගතය ලස්සන වනු දැකීමය. එහිදී ඔවුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා වෙනුවෙන් ලොකු බරපැනක් දරන්නට වන පසුබිමක, ඒ පුංචි හිත්වලට සතුටක් ගෙනෙන්නට ඔබට හැකිනම් එය අපට සතුටකි.

■ දීපා වසන්ති එදිරිසිංහ




අපේ පුංචි නංගිලා මල්ලිලාට දැන් පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න

පාඩම් සඳහා මාර්ගෝපදේශ නිර්දේශිත පිංතූර පොත් දරුවන්ගේ නිපුණතා වර්ධනය පෙන්වයි

මාසික අධ්‍යාපනික පුවත්පත් 6ක්

අප්‍රේල් කලාපයන් දැන් වෙළෙඳපොළේ

අවුරුදු උත්සවය වෙනුවෙන් සැකසූ පින්තූර කොළයක් සමඟ

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348

දැන්වීම් සඳහා විමසන්න ශෙහාන් - 076 1393811

දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් , සරසවි පොත්හල් සහ අනෙකුත් පොත්හල්වලින් මිලදී ගතහැක





GS &Co BELIEVE

Steuart
අත් ගුණය

තාමත් හොයන්නේ අම්මාගේ කෑමවල රසමද?

කටට සැරට අපේ රසට හදන
ඔබේ රසවත් කෑම වේලට
සැබෑ අත්ගුණය මුසු කරන
ශ්‍රී ලාංකේය කුළුබඩු

හඳුන්වා දෙන
අත්ගුණය කුළුබඩු



# පණ දෙන්න කලින් ටිකක් ඈණ වෙලා බලන්න

මට ඇති ලොකුම ප්‍රශ්නය ඔහු හිතාගන්නට බැරිතරම් හොඳ වීමය. මට එය අදහාගත නොහැක. මේ මාගේ පළමු ආදරය වූ අතර මා අතින් ඔහුට වැරදි අඩුපාඩු සිදු වූ බව මම දැන සිටියෙමි.

ඔහුට මුලින් කැමති වී ආයෙමත් අකමැති යැයි කියන්නට සිතුනේ ඇයි දැයි මම නොදනිමි. එය වරදක් බව මම දනිමි. නමුත් මට ඔහුට කැමති වී දවස් දෙකක් ගිය තැන ඔහු සමඟ සම්බන්ධතාවයක් පවත්වාගෙන යන්නට බැහැ කියා සිතුනි. ඒ ඔහුගේ වරදක් නිසා නොවේ. මට දැනුණු අවිනිශ්චිතතාවක් නිසාය. ආදරයක් සොයාගන්නට ඉක්මන් වුවාද, මව්පියන්ට නොදන්වා ඔහුට කැමැත්ත දීම වැරදිද වාගේ විවිධාකාර සිතුවිලි මගේ මනස අවුල් කර දැම්මේය. ඉතින් මම ඔහුට ආයෙමත් බැහැ කියා කීවේ ඔහු කෝපවන බව දැන දැනමය.

"එහෙනම් හා කිව්වේ මොකටද ගෑනියේ? තමුසේ මට බලාපොරොත්තු දීලා දැන් බැහැ කියනවාද?" වාගේ දරුණු පිළිතුරක් සහ බැණවැදීමක් මා බලාපොරොත්තු වෙමින් සිටියෙමි.

එහෙත් ඔහු කළේ නිහඬව මා දෙස බලා මඳ සිනහවක් පෑමය.

මා වික්ෂිප්ත වූයෙමි.

"මම දන්නවා ඔයා මේ හැමදේටම අලුත් කියලා. ඔයාට ඔහොම ඔයා ගත්තු තීරණය ගැන සැක සංකා ඇතිවෙන එක සාධාරණයි." ඔහු නිවී සැනසිල්ලේ කියද්දී මා කටත් ඇරගෙන ඔහු දෙස බලා සිටියෙමි.

ඔහු ඊළඟට ඔහුගේ දකුණතින් මාගේ හිස යන්තමට අතගෑවේ මගේ හදවත ගැහෙන වේගය වැඩි කරලමිනි.

"කලබල වෙන්න එපා. නිවිහැනහිල්ලේ කල්පනා කරන්නකෝ. කරන්න ඕනේ දේ ඔයාටම තේරෙයි." ඔහු කිවේ මා ගල් වී සිටිද්දීය.

මාගේ නෙතට කඳුළු උනාගෙන ආවේ ඒ පරිණත හැසිරීම ළඟය.

"ඒත්... ඒත්... මට හිතෙන්නේ මම ඔයාට ගැළපෙන්නේ නැද්ද කොහෙද. මේ... මේ ඔයා ඔහොම සන්සුන්ව ඉන්නේ කොහොමද මට තේරෙන්නේ නැහැ. සමාවෙන්න." මා කීවේ ගොත ගැසෙමිනි.

එවර ආයෙමත් ඔහු සිනහවකින් මුව සරසා ගත්තේය.

"මට කලබල වෙන්න තරම් දෙයක් මෙතන නැහැ. ඔයා පොඩ්ඩක් කලබල වෙලා. ඔය කලබල ගතිය අඩුවෙලා මා ගැන විශ්වාසය ඇති වුණාම හැමදේම හරියයි. අනිත් එක ඔයා මට කියපු විස්තර අනුව ඔයාට මගේ ආදරේ ලැබෙන එක ප්‍රයෝජනවත් වෙයි. මොකද ඔයාගේ හිතේ ඉන්නවා කිව්වේ ඔයා ගැන හොයලා බලන, කේන්ති නොගන්නා කෙනෙක්. ඉතින් මම දන්නවා මම ඒ වගේ කෙනෙක් කියලා." ඔහු ආයෙමත් නිවී සැනසිල්ලේ කියා දැමූ අතර මගේ හදවත ආයෙමත් ගැහෙන වේගය වැඩි කළේය.

ඔහු ඉතා හොඳ අයෙකු බව මට ආයේ ආයෙමත් වැටහිණි. ඉතින් පසුවද වනවිට මම ඔහු සමඟ ජීවිත කාලයම සිටින්නට තීරණය කළෙමි. ඒ මා පිස්සුවෙන් වාගේ ඔහු හැරයන්නට දඟලද්දී ඔහු අර තරම් සන්සුන්ව ඉවසීම නිසාය. ඒ තරම් කාරුණිකව වදන් හැසිර වූ නිසාය.

දැන් අපගේ ප්‍රේමයට මාස තුනකි. දැන් මට ඇති ලොකුම ප්‍රශ්නය ඔහු මේ තරම් හොඳ ඇයි කියාය. හරියටම වෙලාවට සුබ උදෑසනක් පතන්නට, සුබ රාත්‍රියක් පතන්නට ඔහුට මතක් වේ.

"මගේ හොඳ කෙල්ල."

"පරිස්සමින් ගෙදර යන්න."

"ඔෆිස් එකේ වැඩ පරිස්සමින් කරන්න." වාගේ කෙටි පණිවිඩ එවන්නේය.

ඔහුගේ මේ හොඳ ඇත්තටමද? මට සිතාගත නොහැක.

ඉතින් මම එය සොයාගන්නට ක්‍රමයක් කල්පනා කළෙමි. දින කීපයකට පසුව මට අපූරු කල්පනාවක් සිහියට ආවේය.

මම එකදිගට කවි ලීවෙමි.

ඉන් අනතුරුව ඒවා ඔහුට යැවූවෙමි. යවන සෑම කෙටි පණිවිඩයක් සමඟම හදවත් සලකුණු යවන්නට පටන්ගත්තෙමි.

හදවත් සමඟ කැරකෙන, මල් විසිවෙන gif සොය සොයා ඔහුට යැව්වෙමි.

දවස් කීපයක් යද්දී ටික ටික ඔහු වෙනස් විය. ඔහුගෙන් එන කෙටි පණිවිඩ අඩු විය. උදයට සුබ පතන වෙලාව ප්‍රමාදය. රාත්‍රියට සුබ පතන්නට ඔහුට බැරි වන්නේ ඉබේම ඇඳ මත නින්ද යන නිසා බවට ඔහු නිදහසට කරුණු කියන්නට පටන්ගත්තේය.

> **සම්බන්ධය නවත්තන්න අදහසක් නම් මට නැහැ. මම තේරුම්ගත්තේ මොනවා වුණත්, කාට වුණත් අසීමිතව බැඳෙන්න හොඳ නැති බව**

ඔහොම නිදහසට කරුණු කී දවසක මම හොඳටම සිනාසුණෙමි. සිනාසී අවසන මෙසේ කීවෙමි.

"මම අර කවි ලියලා එව්වේ, හාර්ට් ඉමෝජි, gif එව්වේ මම ඔයාට පිස්සු වැටිලා කියලා පෙන්නන්න ඕනේ වුණ නිසා. මට ඕනේ වුණා එතකොට ඔයා මට පෙන්නන ඔය ආදරේ කරුණාව වෙනස් වෙනවද බලන්න. මම ඇත්තටම ඔයා පෙන්නපු ගතිගුණවලට වහ වැටෙන්න කලින් මම ඒ විදියට බොරුවට පෙන්නලා බැලුවා. ඔයා වෙනස් වේවිද කියලා බලන්න." මම කියද්දී ඔහුගේ දෙනෙත් උඩ යැවිණි.

"මොනවා..."

"හ්ම්... ඔයාගෙ ආදරේට ඇත්තටම පිස්සු වැටෙන්න කලින් මේ දේ දැනගත්තු එක කොච්චර හොඳද? මම ගොඩක් ආදරේ කළාට පස්සේ ඔයා ඔහොම ගණන් උස්සන්න ගියා නම් මට කොච්චර දුක හිතෙයිද?" මා ඇසුවේ හිස් අවකාශයෙනි. ඒ සුසුමක්ද සමඟය.

ඔහු බොහෝ වෙලාවක් නිහඬව කල්පනා කළේය.

"එතකොට ඔයා මට ආදරේ නැද්ද? ඒ කියන්නේ දැන් මම ඉස්සර තරම් ඔයාට අවධානය නොදුන්නු නිසා ඔයා මේ සම්බන්ධය නවත්තන්න හිතනවාද?" ඔහු අවසන ඇසුවේය.

"නැහැ. ඔයාව අත් ඇරලා ඔයාට වඩා හොඳ කෙනෙක් හොයාගෙන යන්න හදනවා නෙවේ. කාගේත් අඩුපාඩු තියෙනවා. කාගේත් හොඳ ගුණ තියෙනවා. අවධානය දෙන එක, හොයලා බලන එක අඩු කළාට ඔයා කවදවත් මගේ හිත රිදෙන වචනයක්වත් කියලා නැහැ මේ වනතුරු. ඒ නිසා සම්බන්ධය නවත්තන්න අදහසක් නම් මට නැහැ. මම තේරුම්ගත්තේ මොනවා වුණත්, කාට වුණත් අසීමිතව බැඳෙන්න හොඳ නැති බව." මම කියද්දී ඔහු මහා බර සුසුමක් හෙළුවේය.

■ සමාධි ඩයස්

# කොට සායට මාරු වුණොත්
# නීතිඥ නෝනලාට වැඩක් කරගන්න වෙලාවක් නැතිවෙයි



නීතිඥවරියන් දැනට අධිකරණයේ පෙනී සිටීමට අඳින නිල ඇඳුම වෙනස් කළ යුතු බවට මේ වනවිට නව ගැසට් පත්‍රයක් සම්මත වී ඇත. සමහරක් මේ ගැන ඉතාමත් සුබවාදීව කතා කළත් බහුතරයක් දෙනා එයට අකමැත්ත ප්‍රකාශ කිරීමට පටන්ගෙන ඇත. මේ අතරතුර අප කාන්තා නීතිඥ සංගමයේ හිටපු සභාපතිනියක් වන මේ වනවිට වැඩ බලන මහේස්ත්‍රාත්වරියක් ලෙසටත් කටයුතු කරන ජ්‍යෙෂ්ඨ නීතිඥ සන්ධ්‍යා තල්දූව මහත්මියට කතා කළේ එවැනි ගැසට් පත්‍රයක් සම්මත කරගැනීමට විශේෂ කරුණක් මුල්වූවාද යන වග දැනගැනීමටයි. මේ ඇය සමඟින් කළ එම සංවාදයේ සටහනයි.

"නීතිඥ වෘත්තිය කියන්නේ රටේ ඉහළම තැනින් නීතිරීති මාලාවක් පනවලා තියෙන ඉතාමත් ගෞරවනීය රස්සාවක්. ඒ නිසා මම පෞද්ගලිකව හිතනවා නීතිඥවරියගේ ඇඳුමත් ඒ ගෞරවයට සාපේක්ෂව විය යුතුයි කියලා. නීතිඥවරියක් අධිකරණයට ඇඳිය යුතු සාරියට විශේෂයෙන් සම්මත වර්ණ කීපයක් තියෙනවා. ඒ තමයි කළු, සුදු, අළු සහ දම් කියන වර්ණ ටික. නමුත් අපේ සමහරක් නීතිඥ නෝනලා ඒ කාලෙ වගේම අදටත් ඒ වර්ණ සංකලනයට ගරු නොකරන අවස්ථාවල් තියෙනවා. අනික සමහරු අදටත් අධිකරණයට අත් රහිත සාරි හැට්ට අඳිනවා. නමුත් මම සහ මගේ සමකාලීන නීතිඥවරියෝ දිවුරුම් දීපු මුල් කාලයේදී අපි අධිකරණයට අඳින සාරියේ සංවරශීලී බව ගැන වගේම වර්ණ ගැනත් ඉතාමත් සැලකිලිමත්ව කටයුතු කළා. ඒක අදටත් එහෙමමයි. ඔය හේතුව නිසයි මම 2017-2018 කාලේ කාන්තා නීතිඥ සංගමයේ සභාපතිවරිය විදියට කටයුතු කරද්දි නීතිඥවරියන්ට සංවරශීලී නිල ඇඳුමක් අඳුන්වා දෙන්න ඕන කියලා එවකට නීතිඥ සංගමයේ සභාපති ජනාධිපති නීතිඥ යූ.ආර්.ඩී.ද සිල්වා මැතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කළේ. ඒ අනුව එතුමා ඉතාමත්ම උනන්දු වෙලා අපිට ඊට අවශ්‍ය සියලු සහයෝගය ලබලා දුන්නා."

එහි ප්‍රතිඵලයක් ලෙස නීතිඥවරියන්ට දිග කලිසමට සුදු පැහැති කමිසය සමඟින් කළු කබාය ඇඳීමට ගැසට් පත්‍රයක් එවකට අගවිනිසුරු ප්‍රියසාද් ඩෙප් මහතාගේ අනුමැතිය සහිතව සම්මත වූ බවයි ඇය කියන්නේ.

"හිටපු අගවිනිසුරු ප්‍රියසාද් ඩෙප් මැතිතුමා වගේම එවකට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරියක් විදියට කටයුතු කරපු ජීවා වනසුන්දර මැතිනියත් ඊට ලොකු සහයෝගයක් ලබලා දුන්නා. ඒ වුණාට ඔය ගැසට් පත්‍රයට අත්සන් කරලා දවස් දෙකකට පස්සේ තමයි ප්‍රියසාද් ඩෙප් අගවිනිසුරුතුමාගේ විශ්‍රාමික උත්සවය සංවිධානය වෙලා තිබුණේ. ඒ නිසා එතුමා විසින්ම අනුමැතිය දීපු ඒ නිල ඇඳුම මුල්ම වතාවට එතුමාගේ විශ්‍රාම උත්සවයටම අඳින්න මමත් මගේ ලේකම්වරියත් කටයුතු කළා. එතැනදී අගවිනිසුරුතුමාත් අපි එක්ක මාධ්‍යවල ඡායාරූපවලට පෙනී ඉඳලා ඒ නිල ඇඳුමේ නීත්‍යානුකූලභාවය තවදුරටත් තහවුරු කළා. එතැනින් පස්සේ ගොඩක් කාන්තා නීතිඥවරියන් ඒ නිල ඇඳුමෙන් අධිකරණයට යන්නත් කටයුතු කරලා තිබුණා. හැබැයි එතුමා විශ්‍රාම ගිහිල්ලත් මාස හයක් විතර යනකොට තමයි අපිට දැනගන්න ලැබුණේ ඒ ගැසට් පත්‍රයට තවදුරටත් එතුමාගේ අත්සනක මදිපාඩුවක් තියෙනවා කියලා. නමුත් මේකට ඊටපස්සේ පත්වෙලා ආපු විනිසුරුතුමන්ගෙන් සැලකිය යුතු අවධානයක් නොලැබුණු නිසා ඒ කතාව එහෙමම යටපත් වුණා."

මෑතකදී සම්මත වුණ නව ගැසට් පත්‍රය ගැනත් ඇය කියන්නේ මෙවැන්නක්.

"අලුතෙන් සම්මත වෙලා තියෙන ගැසට් පත්‍රයට දැන් අපි අඳින සාරියයි, අලුතෙන් කළු කොට සායකුත් එක්ක එදා මම මූලික වෙලා සම්මත කරගත්තු කලිසමයි කමිසයයි කළු කබායයිත් ඇතුළත් කරලා තියෙනවා. මගේ මූලිකත්වයෙන් සම්මත වුණ ඇඳුමත් මේ ගැසට් පත්‍රයට ඇතුළත් කරලා තියෙන එකට මම පෞද්ගලිකව සතුටු වෙනවා. නමුත් කොට සාය කොයිතරම් දුරට සාර්ථක වෙයිද කියන එක ගැන මට පොඩි ගැටලුවක් තියෙනවා. මොකද අපේ නීතිඥ නෝනලා සාරියේ පාට විකෘති කරලා ඇන්දා වගේම ඔය සායේ දිග පළලත් විකෘති කරලා අඳින්න පටන්ගත්තොත් ඕක විශාල ගැටලුවක් බවට පත්වෙනවා. ඊළඟට ඒවා පාලනය කරන්න වෙනත් නීති සම්මත කරන්න මහන්සි ගන්න වෙනවා. නමුත් අපේ නීතිඥ නෝනලා ටික එහෙම නොවී සම්මත දිග, පළලට අනුව ඔය කියන සාය ඇන්දෙත්, අදාළ පාටින් විතරක් සාරිය ඇන්දෙත් ඔය දෙකේම කිසිම ගැටලුවක් මම දකින්නෙත් නෑ. මොකද එදාට වඩා අද ගොඩක් වෙනස්. ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවලින් නීති අධ්‍යාපන ලබාගෙන නීති විද්‍යාල පුහුණුවට එන නීති ශිෂ්‍යයාවෝ ප්‍රමාණයත් වැඩියි. ඒ සමහරක් අය ඔය සාරි, ඔසරි අධිකරණයට ගැළපෙන විදියට අඳින්නවත් දන්නේ නෑ. එහෙම එකේ ඕකට තව කොට සායකුත් පටලවගත්තොත් හැමවෙලාවෙම ඕකෙ දිග, පළල මැන මැන ඉන්නවා ඇරෙන්න අධිකරණයේ වැඩක් කරගන්න වෙලාවක් නැතිවෙයි කියලා මට හිතෙනවා. ඒක ඒ අයට කාලයක් තිස්සේ ලැබුණු ආභාෂයේ වරදක් මිසක එයාලගේ වරදක් නෙවෙයි. එහෙමයි කියලා අපිට මේ වෘත්තියේ ගෞරවය නැති වෙනකන් බලාගෙන ඉන්නත් බැහැ. ඒකයි මම කලිනුත් කිව්වේ කලිසම කමිසය එක්ක කළු කබාය ඇන්දම ඔය කියන ප්‍රශ්න මොකුත් නෑ කියලා. ඒ විතරක් නෙවෙයි එහෙම ඇන්දම නීතිඥවරියන්ගෙනුත් නීතිඥ මහත්තුරුන්ට සාපේක්ෂව වෘත්තියට ගැළපෙන විදියට ගරු ගාම්භීරත්වයක් පේන්න පුළුවන්.



වැඩ බලන මහේස්ත්‍රාත්
ජ්‍යෙෂ්ඨ නීතිඥ
සන්ධ්‍යා තල්දූව

නමුත් නීතිඥවරියෝ විදියට අපිත් සාමාන්‍ය කාන්තාව අඳින කොට සායම ඇඳගෙන අධිකරණයට යන්න පටන්ගත්තොත් ඉදිරි අනාගතයේදී මිනිස්සු අපේ පිටට තට්ටු දාලා කතා කරන තත්ත්වයකට පත්වෙයිද කියලත් කියන්න බෑ. මම කියන්නේ අපි නීතිඥවරියෝ විදියට අනිත් කාන්තාවට වඩා ඉහළින් ඉන්න ඕන කියලම නෙවෙයි. ඒකෙන් අධිකරණය සහ රටේ නීතිය හෑල්ලුවට ලක්වෙනවා කියන එක. එහෙමයි කියලා මම සාරිය සහ කොට සාය විවේචනයට ලක්කරන්නෙත් නෑ. නමුත් කොට සායේ දිග, පළලටයි සාරිවල තියෙන අඩුපාඩු හොයන්න කාලය කැප කරනවට වඩා ප්‍රියසාද් ඩෙප් අගවිනිසුරුතුමා සම්මත කරලා ගිය කලිසම කමිසයත් එක්ක කළු කබාය අඳින එක නීතිඥවරියන්ට සුදුසුයි කියන එකයි මගේ පෞද්ගලික මතය."



■ ලිහිණි මධුෂිකා

**සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**




# සල්ලි හොයන්න දන්නේ නෑ ඒත් ආදරේ බෙදන්න මං දන්නවා

ජීවිතේ සතුට හොයාගන්න ටිකක් මහන්සි වෙන්න වුණාට කිසිම මහන්සියක් නැතුව දුක අපිව හොයාගෙන එන වෙලාවල් තියෙනවා. හැබැයි ඒවාට මුහුණදෙන්නත් අපි ශක්තිමත් වෙලා ඉන්න එක වටිනවා.

සමහරවෙලාවට මානසිකව කඩාගෙන වැටෙන සිදුවීමක් වුණාම අපේ ජීවිතේ එතැනින් ඉවරයි, ආපහු ජීවිතයක් නෑ වගේ හැඟීමක් අපිට දැනෙන්න ගන්නවා. හරියටම කිව්වොත් ජීවිතේ එකතැන නතර වෙලා වගේ. ඒත් ඇත්තටම එහෙම නතරවීමක් වෙන්නේ නෑ. ජීවිතේ පුරුදු විදියටම ගලාගෙන යනවා. මොකක් හෝ අනපේක්ෂිත දෙයක් වුණාම ඒ මත්තේ නැහි නැහි නතර වෙන්නේ අපි මිසක් ජීවිතේ නෙවෙයි. හැබැයි ඒ වෙලාවට 'මේක හරි කරුමයක්' කියලා අපි චෝදනා කරන්නේ මේ ජීවිතයට. මාව කඩාගෙන වැටුණ තැන්වල මාත් එහෙම කළා. එකතැන පල්වෙවී ජීවිතේට දෝෂාරෝපණය කළා. පස්සේ තේරුම්ගත්තා නතර වෙලා ඉන්නේ මම විතරක් බව. ජීවිතේ ගලාගෙන යනවා. ඒකත් එක්ක මාත් ඉස්සරහට නොගියොත් මට පැවැත්මක් නෑ කියලා මම තේරුම්ගත්තා.

අපි හැමෝටම නොහිතන දේවල්වලට මුහුණ දෙන්න වෙනවා. සමහර අයගේ පවුල් දෙකඩ වෙනවා, කසාද බඳින්න ඔන්න මෙන්න තියෙද්දි කසාද නොකෙරෙන තැනට හේතු යෙදෙනවා, දරුවෝ බලාපොරොත්තුවෙන් ඉන්න අයගේ පිළිසිඳගන්න කුළුදුල් දරුවා නැතිවෙනවා, නොහිතන විදියට අම්මා තාත්තා නැතිවුණාම ඒවා දරාගන්න බැරිව මුළු ජීවිතේම කඩාගෙන වැටෙනවා.

මටත් එහෙම වුණා... මගේ තාත්තා නැතිවුණාම මට දැනුණේ මගේ මුළු ලෝකෙම නැතිවුණා වගේ. මට හිත හදාගන්න අමාරුවුණා. මිනිස්සු ඉපදෙනවා මැරෙනවා කියන දේ විශ්වාස කරන්න බැරිතරමට මං ඇඬුවා. මට හැමවෙලේම හිතුණා තාත්තාට තව ඉන්න තිබුණා කියලා. පිය සෙනෙහස ගැන ලියැවුණු කවියක් ගීයක් දැක්කත් මගේ ඇස්වල ඉබේම කඳුළු පිරුණා. කසාද බැඳලා දරුවෝ හදලා හිටියත් ඒ වෙද්දි මට දැනුණේ මගේ ලෝකෙම නැති වුණා වගේ. ඒ පීඩනය එක්ක මං දහම් එක්ක ප්‍රශ්න ඇති කරගත්තා.



මගේ ජීවිතේ ඇතුලේ පසුතැවෙන ප්‍රශ්න ඇතිකරගෙන මට මාව එපාවෙන තැනටම පත්වුණා.

**"තාත්තා ආස ඔයා අඬනවට නෙවෙයි සතුටෙන් ඉන්නවාට, එතකොටයි එයාට පිං ලැබෙන්නේ."** දවසක් දහම් මට එහෙම කිව්වා.

ඊටපස්සෙයි මම ටික ටික හිත හදාගත්තේ. හොඳ විදියට ජීවිතේ දකින්න ඕනේ කියන දේ තේරුම්ගත්තේ. ඉතින් මම ජීවිතේ අලුතෙන් පටන්ගත්තා. මගේ වැරදි අඩුපාඩු හදාගන්න ගමන් ජීවිතේට පොඩ්ඩ පොඩ්ඩ සතුට එකතු කරගත්තා. වැරදි අඩුපාඩු හදාගෙන මාව ගොඩ නගාගත්ත විදිය ගැන සමජමාධ්‍යවල ලිව්වා. මං ලිව්වේ සල්ලි හම්බකරන විදියවත්, කෝටිපතිනියක් වෙන්නේ කොහොමද කියලාවත් නෙවෙයි. මං ලිව්වේ හොඳ ගැහැනියක් වෙන විදිය. අඩුපාඩු හදාගෙන මගේ දරුවන්ට හොඳ අම්මා කෙනෙක් වෙන්න උත්සාහ කරන විදිය. අදටත් මං ඒ ගැන ලියනවා. මේ පුවත්පතට වගේම මගේ මුහුණුපොතේත් ලියනවා. ඒ දේවල් කියවලා තමන්ගේ ජීවිත එක්ක ගලපගෙන සතුටින් ඉන්න අය වයස් භේදයක් නැතුව මට කතා කරනවා, ස්තුතිවන්ත වෙනවා. ඉතින් ඒ දේවල් මගේ හිත සතුටෙන් සැනසීමෙන් පුරවනවා.

තාත්තා නැතිවුණ එකට තවමත් අඬ අඬ හිටියානම් හෂිණි මනමේන්ද්‍ර කියලා කෙනෙක් ඔයලා නොදැන ඉන්නත් ඉඩ තිබුණා. තාත්තාගේ වියෝව සහ එයින් පස්සේ ජීවිතේ වුණ සිද්ධීන් හින්ද උපරිමව මානසිකව වැටුණත් අද මං මාව ගොඩනගාගෙන තියෙනවා ශක්තිමත් සහ සතුටින් ඉන්න ගැහැනියක් විදියට. ඒ වෙනුවෙන් මාව දිරිමත් කරපු අය අතරේ උඩින්ම හිටියේ දහම්.

මට ඕන වුණේ මගේ හිතට එකඟව හොඳ ගැහැනියක් වෙන්න විතරයි. ලෝකේ ඉන්න හොඳම අම්මා නොවුණත් මගේ දරුවන්ට හොඳම අම්මා වෙන්න, මගේ සංසාරික ගමන් සගයාගේ ආදරණීය සහකාරිය වෙන්න. සුන්දර ගැහැනියක් වෙලා තව ගැහැනියකට ගැහැනුකම එපා නොවෙන විදියට ආදර්ශයක් වෙන්න. සල්ලි හොයන්න මං දන්නේ නෑ. ඒත් මං දන්නවා ආදරේ බෙදන්න.

මානසිකව කඩාගෙන වැටෙන කිසිම වෙලාවක ජීවිතේ එතැනින් ඉවරයි කියලා හිතන්න එපා. එහෙම කඩාගෙන වැටුණාම අපි වැරදිවලට යොමුවෙන්න තියෙන ඉඩකඩ වැඩියි. ඒ නිසා එහෙම වෙලාවට ඔයාට වැඩියෙන්ම ළෙන්ගතු කෙනාට කතා කරලා හිත නිදහස් කරගන්න. නැත්තම් මනෝ උපදේශිකාවකගෙන් සහාය ලබාගන්න. ටික ටික හෙමීට ඔළුව උස්සගන්න. ඔයා ආසම දේ මුලින් කරන්න. ඒකෙන් සතුට හොයාගන්න. එතකොට ඔයාට කාටවත් හිරිහැරයක් නැති කරදරයක් නැති සුන්දර මාර්ග පෙනේවි. ඒ මාර්ගවල බය නැතුව යන්න. ඔයාගේ දක්ෂකම් ඔයාටම හොයාගන්න පුළුවන්. එතකොට ඔයාට දැනෙයි ජීවිතේ මග නතර වෙලා නෑ, ඔයයි නතර වෙලා හිටියේ කියලා. ඒ යන ගමනෙදි වචනෙකින්වත් කාටවත් වැරැද්දක් නොකර ඉන්නත් වගබලා ගන්න. ඔයාව විශ්වයේ බලයෙන් ආරක්ෂා වේවි.

ඔයා ඉරක් වෙන්න. මං එහෙම කිව්වේ ඇයි දන්නවද? මේ ලෝකේ මොන විපර්යාසය වුණත් ඉර පායනවා. ඒ නිසා මොන දේ වුණත් ඔයත් ඉරක් වගේ පායන්න.

මානසිකව කඩාගෙන වැටෙන දේවල් වෙන්නේ අපි කොච්චර ශක්තිමත්ද කියලා තේරුම්ගන්න මිසක් එතැන තැවිලා අපිව නැති කරගන්න නෙවෙයි. ඒ නිසා පුළුවන් තරම් ශක්තිමත් වෙන්න. සමහර වෙලාවට අපිට තියන එකම තෝරාගැනීමත් ඒක විතරයි. ඉතින් ශක්තිමත් වෙන්න. ආයේ ඔයා දිහා හැරිලා බලද්දි ඔයා ගැන සතුටු හිතෙන විදියට ඔයාව ගොඩනගාගන්න.

මේ අලුත් අවුරුද්දේ ඒ වෙනුවෙන් හොඳ ආරම්භයක් කරගන්න කියලත් මම යෝජනා කරනවා. ඉතින්, ඔබ සියලුදෙනාටම ආදරය, සතුට ඉතිරෙන සුබ අලුත් අවුරුද්දක් වේවා!!!

■ **හෂිණි මනමේන්ද්‍ර**

**මාව කඩාගෙන වැටුණ තැන්වල මාත් එහෙම කළා. එකතැන පල්වෙවී ජීවිතේට දෝෂාරෝපණය කළා. පස්සේ තේරුම්ගත්තා නතර වෙලා ඉන්නේ මම විතරක් බව. ජීවිතේ ගලාගෙන යනවා. ඒකත් එක්ක මාත් ඉස්සරහට නොගියොත් මට පැවැත්මක් නෑ කියලා මම තේරුම්ගත්තා**

පසුගිය වසරේ ජූලි මාසයේ ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ, ඕස්ට්‍රේලියාව සමඟ තරඟ දෙකකින් යුත් ටෙස්ට් තරඟාවලියේ දෙවැනි තරඟය පැවැත්වෙමින් තිබුණි. එහිදී මුලින් පන්දුවට පහරදුන් ඕස්ට්‍රේලියාව පළමු ඉනිමට ලකුණු 364ක් ලබාගත් අතර දිනේෂ් චන්දිමාල්ගේ සුපිරි පිතිතරඹයෙන් පසු ශ්‍රී ලංකාව පළමු ඉනිමට ලකුණු 554ක් ලබාගැනීමට සමත්විය. පළමු ඉනිමට වඩා ලකුණු 190ක් පිටුපසින් සිට නැවත ඕස්ට්‍රේලියාව සිය දෙවැනි ඉනිම ඇරඹූ අතර සිදුවුණේ කිසිවෙකුත් නොසිතූ සිදුවීමකි. ඒ ප්‍රබල ඕස්ට්‍රේලියානු කණ්ඩායමේ සියලුදෙනා ලකුණු 151ට දැවීයාමයි. ඒ අනුව ඉනිමකින් සහ ලකුණු 39කින් ශ්‍රී ලංකා කණ්ඩායම තරඟය ජයග්‍රහණය කළේය. තරඟයේ වීරයා වූයේ එක් ඉනිමකදී කඩුලු හය බැගින් ඉනිම දෙක තුළදී කඩුලු 12ක් බිඳහෙළූ ප්‍රභාත් ජයසූරියයි. එදා මංගල තරඟයට ක්‍රීඩා කරමින් එවන් දක්ෂතාවක් දැක්වූ ප්‍රභාත් අද ශ්‍රී ලංකා ටෙස්ට් කණ්ඩායමේ ප්‍රධානම දඟපන්දු යවන්නා බවට පත්ව තිබේ. දන්නා දේ එසේ වෙද්දී ඔහු පිළිබඳව නොදත් දේ ගැන මේ කතාබහ ප්‍රභාත්ගේ ආදරණීය බිරිඳ රනීෂා මිරැන්ඩෝ සමඟිනි.

# එයා පිට්ටනියේ ඉන්න දවසට මම වැඩිපුරම ඉන්නේ දෙවියෝ බුදුන් ළඟ

## ප්‍රභාත් ජයසූරියගේ බිරිඳ රනීෂා මිරැන්ඩෝ



**මේ දවස්වල රනීෂා ඉන්නේ හරි සතුටින් කියලා ආරංචියි. ඇත්තද?**

ඒක ඇත්ත. මං කවදාවත් නැති තරම් සතුටකින් දැන් ඉන්නේ. ඒ ප්‍රභාත් නිසා. එයා ජාතික කණ්ඩායමට එන්න ගොඩාක් හීන දැක්කා. අද වෙනකොට එයා අපේ ටෙස්ට් කණ්ඩායමට නැතුවම බැරි ක්‍රීඩකයෙක් වෙලා. ඒ ගැන සතුටු නොවී කොහොමද?

***රනීෂාට ප්‍රභාත්ව මුණගැහුනේ කොහොමද?**

මුලින්ම එයා මුණගැහුනේ ෆේස්බුක් එකෙන්. ඒත් චැට් කළේ එහෙම නෑ. මං මීගමුවේ. දවසක් මං බඩු වගයක් ගන්න වත්තල සුපර් මාර්කට් එකකට ආවා. ඒ 2015 අවුරුද්දේ දවසක. එදා තමයි එයාව මුලින්ම දැක්කේ. එදා අපි කතා කළා. පස්සේ ෆේස්බුක් එකෙන් චැට් කළා. අන්තිමේ ඒ යාළුකම ආදරයක් දක්වාම දුරදිග ගියා.

***එතකොට ප්‍රභාත් මුණගැහෙද්දි එයා ක්‍රිකට් ක්‍රීඩා කරනවා කියලා දැනගෙන හිටියද?**

ක්‍රිකට් ගහනවා කියලා දැනගෙන හිටියා. ඒත් ඒ දවස්වල ක්ලබ්වල තමයි ක්‍රිකට් ගැහුවේ.

***කෙනෙක් ගැන කැමැත්තක් ඇතිවෙන්නත් හේතුවක් තියෙන්න එපැයි. ඔයා ප්‍රභාත්ට කැමතිවුණේ ඇයි?**

එයා හරි අහිංසකයි. අම්මට තාත්තට ගොඩාක් ගරුකරන කෙනෙක්. ඉතින් එහෙම කෙනෙක් බිරිඳට වරදක් කරන්නේ නෑනේ. ඒ දේවල් එක්ක මං ටිකක් කල්අරන් එයාට කැමතිවුණා.

***හැබැයි මුලදි නම් ප්‍රභාත්ට ඔයාලගේ ගෙදරින් විරුද්ධ වුණාලු නේද?**

මුලදි ටිකක් විරුද්ධ වුණා. ඒත් මං එයාව අතෑරියේ නෑ. අන්තිමේ අපේ ගෙදරින් ප්‍රභාත්ට එන්න කියලා කැමැත්ත දුන්නා. පස්සේ 2018 ජූලි 21 වැනිදා අපි විවාහවුණා. දැන් අපිට අවුරුදු හතරක පුංචි දුවෙක් ඉන්නවා.

***ඔයා ප්‍රභාත් ඉන්න මැච් බලන්නේ නෑ කියන්නේ ඇත්තද?**

(සිනාසෙමින්) ඒක ඇත්ත. මට එයා ඉන්න මැච් බලන්න බය හිතෙනවා. මට හිතෙනවා මං බලද්දි එයාට කඩුලු ගන්න බැරිවෙයි කියලා. ඒ නිසා එයා කඩුලු කීයක් ගත්තද ලකුණු කීයක් ගැහුවද බලන්නේ මැච් එක ඉවරවුණාට පස්සේ ඉන්ටර්නෙට් එකට ගිහිල්ලා. ඒත් මැච් නොබැලුවට මැච් තියෙන දවසට නිතරම දෙවියෝ බුදුන් ළඟට ගිහින් වැඳලා ඉල්ලනවා ප්‍රභාත්ට කඩුලු ලැබෙන්න කියලා.



මං විහිලුවට වගේ කියනවා “දැන් කොල්ලට කෙල්ලෝ එහෙම මැසේජ් කරනවා ඇති නේද” කියලා. ඒ වෙලාවට එයා විහිලුවට කියනවා “ඔව් ඔව් දිගට හරහට මැසේජ් එනවා ඔයාට පෙන්නන්න මං මේ තියාගෙන ඉන්නේ” කියලා

***සාමාන්‍යයෙන් ක්‍රිකට් ක්‍රීඩකයින්ට ලොකු කාන්තා ආකර්ෂණයක් තියෙනවනේ. ප්‍රභාත්ටත් එහෙම ඇති නේද?**

(සිනාසෙමින්) ඇති ඇති. ඒත් මං විහිලුවට වගේ කියනවා “දැන් කොල්ලට කෙල්ලෝ එහෙම මැසේජ් කරනවා ඇති නේද” කියලා. ඒ වෙලාවට එයා විහිලුවට කියනවා “ඔව් ඔව් දිගට හරහට මැසේජ් එනවා ඔයාට පෙන්නන්න මං මේ තියාගෙන ඉන්නේ” කියලා. ඒත් එයාට එහෙම ආදරේ කරන පිරිසක් ඉන්නවට මං ආසයි.

***ප්‍රභාත්ව ක්‍රිකට් ක්‍රීඩකයෙක් කරන්න එයාගේ අම්මා ගොඩාක් කැපකිරීම් කරාලු නේද?**

ඔව්. එයාගේ අම්මා ක්‍රිකට්වලට හරිම ආසයි. එයා 1996 ලෝක කුසලානයත් ප්‍රභාත්ව ඔඩොක්කුවේ තියාගෙන බැලුවලු. ඉස්සර ප්‍රභාත් ක්‍රිකට් ගහනවට එයාගේ තාත්තා කැමතිවෙලා නෑ. ඉතින් තාත්තට හොරෙන් තමයි අම්මා ප්‍රභාත්ව පුහුණුවීම්වලට යවලා තියෙන්නේ. හැබැයි දැන් නම් තාත්තාත් ක්‍රිකට්වලට ආසයි.



***අපේ මතකය හරි නම් ප්‍රභාත් මුලින්ම ජාතික කණ්ඩායමට එන්නේ 2018 අවුරුද්දේ නේද?**

ඔව්. 2018 දි දකුණු අප්‍රිකාව එක්ක එක්දින තරඟමාලාවට එයා ක්‍රීඩා කළා. ඒත් ප්‍රභාත් කවුද කියලා හැමෝම දැනගත්තේ පහුගිය අවුරුද්දේ තමයි.

***ඉස්කෝලේ කාලේ එහෙම ප්‍රභාත් ටිකක් දඟ ළමයෙක්ලු. ඒ ගැන එහෙම එයා ඔයත් එක්ක කියලා නැද්ද?**

(සිනාසෙමින්) එයාගේ අම්මා මගෙත් එක්ක කියලා තියෙනවා ප්‍රභාත් පොඩි කාලේ හරි දඟයි කියලා. ඉස්කෝලේ කාලේ එයාට තිබුණු ලොකුම චෝදනාව වුණේ කොයි වෙලාවකවත් පන්තියේ නෑ කියන එකලු. ඇයි ඉතින් උදේට ඉස්කෝලේ යනවා කියලා ගියාට දවසම ඉන්නේ පිට්ටනියෙලු. අනික තමයි එයා ඒ කාලේ පාරේ යද්දි ගල් කැටයක් පේන්න බැරිලු. අහුලගෙන අත කරකවලා බෝල් කරන විදියට විසිකරනවලු. ඉතින් අම්මා බණිනවලු පාරේ යන මනුස්සයෙක්ගේ නැත්නම් වාහනේක වදියි කියලා. ඒත් මෙයා කියන දෙයක් අහන්නේම නැතිලු.

***ඔය අතරේ එයාට දරුණුවටම රෙස්ලින් පිස්සුවකුත් තිබුණාලු නේද?**

ඒත් පොඩි කාලේ. ප්‍රභාත් හැමදාම වගේ රෙස්ලින් සීඩී ගෙනැත් මල්ලිත් එක්ක බලනවලු. හැබැයි ටිකකින් දෙන්නා නැතිලු. බලද්දි කාමරේ දොර වහගෙන මල්ලිත් එක්ක රෙස්ලින් ගහගන්නවලු. එයාගේ අම්මා කියන විදියට දිනුවම උස්සන්න කාඩ්බෝඩ්වලින් රෙස්ලින් බෙල්ට් එකක් එහෙමත් හදාගෙන ඉඳලා තියෙන්නේ.

***එතකොට එයා ගෙදරදී මොන වගේ කෙනෙක්ද?**


හරිම නිහඬ කෙනෙක්. කටින් වචනයක් ගන්න හරි අමාරුයි. වෙලාවකට මට තරහත් යනවා. හැබැයි එයා ලස්සනට අඳින්න කරන්න ආසයි. බතුයි පරිප්පුයි පොල් සම්බෝලයි කරවල තෙල් දාලයි කන්න පුදුම ආසාවක් තියෙන්නේ. නරකකට තියෙන්නේ ටිකක් වැඩිපුර පැණි රහ කන එක තමයි.

***අවසාන වශයෙන් ප්‍රසිද්ධ ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳක් වෙන්න ලැබුණු එක ගැන රනීෂාට තියෙන්නේ මොන වගේ හැඟීමක්ද?**

ඒක නිහතමානී ආඩම්බරයක් කියලත් කියන්න පුළුවන්. මොකද ක්‍රිකට් ක්‍රීඩකයෙක් කියන්නේ රටක් ලෝකයක් දන්න කෙනෙක්නේ. හැබැයි ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳකට ක්‍රිකට් ගැන හොඳ අවබෝධයක් තියෙන්න ඕනේ. මොකද ක්‍රිකට් ක්‍රීඩකයෝ කියන්නේ හරිම කාර්යබහුල පිරිසක්නේ. ඉතින් ඒ අය වෙනුවෙන් බිරිඳකට ගොඩාක් කැපකිරීම් කරන්න වෙනවා.

■ රුවන් එස්.සෙනවිරත්න

# ඇයි ඔයා සමාව ඉල්ලන්නේ? මට වැරැද්දක් කළාද?



## අවසරයි

බියංකා නානායක්කාර ලියයි

117 කොටස

තේනුක තෙන්නකෝන් සොහොයුරියව බදාගෙන මොහොතක් වෙලා එහෙමම සිටියේය. ඒ මොහොත ඔහුගේ සිතේ සියලු සිතුවිලිවලින් හිස්වූ එකක් විය. සැබැවින්ම ඒ අවස්ථාව ඔහුට නෙතු තෙත් කරන්නට තරම් සංවේදී වුණෝය.

**"ඔයා කවද්ද ලංකාවට ආවේ..? මොකද්ද මේ ඕගොල්ලො ඩ්‍රාමා එකක් රඟපානවා වගේ..."**

තේනුක කතා කරන්නට වචන ආ මොහොතේ කීවේ දිලිසෙන ඇස්වලින් සිනාසෙමිනි. ඔහු සෙනුකා අක්කාට අම්මාට තරමටම ආදරය කළේය. ජපානයේ ඉන්නා තුරාවට තේනුකගෙ නිදහස ඔහුට දී බලාගත්තේ ඇයයි. තේනුක තෙන්නකෝන් සෙනුකාගේ අතින් ඇදගෙනම ගොස් සැටි පුටුවෙන් ඉඳගත්තේය. ඒ මොහොතේවත් සෙනෙහෙලතා මැණිකේ පේන්නට නොපැමිණීම තේනුක තෙන්නකෝන්ගේ හිතට ප්‍රශ්නයක් විය.

**"කෝ අම්මා?"**

ඒ නිසාම ඔහු ඇසුවේ සෙනුකාගේ ආගිය තොරතුරු කතා කරන්නට පෙරය.

**"ඔන්න ඔයා එයාට මොකුත් කියනවා එහෙම නෙවේ මල්ලි. මමයි කිව්වේ මං ආවා කියලා ඔයාට කියන්න එපා කියලා. මට ඕන වුණේ ඔයාව සර්ප්‍රයිස් කරන්න."**

තේනුකගේ හිතේ ඇති ප්‍රශ්නයට එය සම්පූර්ණ උත්තරයක් නොවීය. එය නොකියා සිටියත් සෙනෙහෙලතා මැණිකේට තමන් හා කතා කිරීමේ බාධවක් නැත. ගෙවුණු දිනවල ඈ කතා කළේද වචන දෙක තුනකි. ඊට උත්තරයක් සොයාගත යුතුමය.

**"හරි ඔයා ආව එක නොකිව්වා කියමුකෝ. ඇයි අම්මා මා එක්ක වෙනද වගේ කතා නොකළේ..? මං මේ කොළඹ ආවේ ඉක්මනට අම්මා හම්බවෙන්න ගිහින් ඒකට උත්තරේ අහගන්න..."**

තේනුක තෙන්නකෝන්ගේ කතාවට සෙනුකා සිනාසුණාය.

**"මල්ලි මේ, ඔයා දන්නවනේ... ඉස්සර ඉඳලම අම්මට බොරු කරන්න බෑ කියලා... මං ආව එක ඔයාට හංගන්න බැරිවෙලා ඇත්ත කියවෙයි කියලා තමයි එහෙම වුණේ. ආන් ඔයාට රසට කන්න දෙන්න කියලා කුස්සියට වෙලා කමල් එක්ක උයනවා..."**

තේනුකට කාමරය මතක් වුණෝය. ඔහු සෙනුකා විසිත්ත කාමරයේම හිඳුවා, ඉක්මනින් ගෙතුළට දිවගියේය. ඔහුගේ පපුවට සැහැල්ලු හුස්ම පොදක් පිරුණෝ එවිටය. කාමරයේ දොර වැසී තිබුණි එය කමල්ගේ වැඩක් වන්නට ඇත. ඔහු සේවකයෙකුටත් වඩා තමන් විෂයේ සැලකිලිමත් වෙන අයෙක් කියා තේනුක දැන සිටියේය. ඒ නිසාම ඔහු කමල්ට හිතින් ස්තුති කළේය.

වටපිට බලා යතුරුලා තිබූ කාමරය ඇර තේනුක එතුළට ගියේය. ඇඳුම් වැටේ තිබූ අංජනාගේ ඇඳුම් ටික ගුලියට එක් කරගත් තේනුක තෙන්නකෝන් ඒවා අල්මාරියේ යටම තට්ටුවට එබුවේය. වටපිට බලද්දී කණ්ණාඩි මේසය මත වූ ඇගේ කොණ්ඩ මල් ටික දුටුවෙන් ඒවාත්, රබර් සෙරෙප්පු ජෝඩුවත් ඔහු අල්මාරියේ යට තට්ටුවේ තැබුවේය. කොහොමත් අම්මාට මේ කාමරය බලන්නට ඕනෑවුණොත් සැකක් නොසිතෙන සේ තිබිය යුතුය. අල්මාරිය වසා යතුරු දමා ඔහුට පසුපස හැරෙන්නට බැරි වුණෝය.

**"මං ඒත් කමල්ගෙන් ඇහුවා මොකද මේ කාමරේ වහලා කියලා. යතුර ඔයා ළඟ කිව්වේ..."**

කමරය අස්කර විනාඩියක් යන්නට මත්තෙන් සෙනෙහෙලතා මැණිකේගේ කටහඬ දොර ළඟින් ඇසුණෝය. තේනුක ආපිට හැරී අම්මා දෙස බලද්දී පෙනුණෝ ඇගේ පුරුදු කරුණාවන්ත මුහුණය.

**"ඔයා මොකද මාත් එක්ක තරහවෙලා වගේ හිටියෙ..? මට ඒකට උත්තරයක් දීලා ඉන්නකෝ ඔක්කෝටම කලින්..."**

තේනුක සෙනෙහෙලතා මැණිකේ ළඟට එමින් ඇසුවේය.

**"මගෙ තරහක් නෑ පොඩිපුතා... කෝ අක්කා...?"**

**"තරහක් නැත්තම් මං කොළඹත් නොහිටිය වෙලාවේ ඔයා මගෙ ඔළුව අවුල් කළේ.. මං ලොකු වැරැද්දක් කළා වගේ...?"**

**"මං ඔයාට මොකුත් කිව්වෙ නෑනෙ එහෙම ඔළුව අවුල්වෙන්න..?"**

**"ඒක තමයි මාත් කියන්නේ... මොනවහරි කිව්වානම් ප්‍රශ්නයක් නෑ අම්මා. මොකුත්ම නොකියනෙ ඔයා ටෙලිෆෝන් කෝල් කට් කළේ..."**

**"අක්කා කිව්ව විදියට කතා කළේ. ඔයත් එක්ක වැඩිය කතා කරලා අක්කා ආවා කියලා කියවුණා නම් එයා තරහවෙනවා... දන්නවනේ එයා පොඩි කාලෙත් තරහ වුණොත් යාළුකරගන්න අපි කොච්චර මහන්සිවෙනවද?"**

ඔවුන් කතා කරමින් විසිත්ත කාමරයට ගියහ. එහි සෙනුකා මෙන්ම චතුමිණීද රූපවාහිනිය දෙස බලාගෙන උන්හ.

**"අහගත්තද මං කේලම් කිව්වද කියලා..? නැන්දම්මා දන්නෙ නෑ... මාව මරන් කන්න ලෑස්තිවෙලා හිටියෙ ඔයාට මං මෙයා ගැන කේලම් කිව්වා කියලා..."**

ඔවුන් දකිත්ම චතුමිණී කීවාය.

**"සුදු මැණිකෙ ඕවා ගණන් ගන්න එපා..."**

සෙනෙහෙලතා මැණිකේ චතුමිණී ළඟම පුටුවෙන් ඉඳගනිමින් කියද්දී තේනුකට අම්මා සමඟ බේරාගන්නට තවත් ගනුදෙනුවක් මතක් වුණෝය. ඒ චතුමිණීට මේ නිවස පෙන්වීමය. එය නම් සෙනෙහෙලතා මැණිකේ කළ බරපතළ වරදක් බව ඔහුගේ සිත යළිත් කීවේය. එය අසන්නටත් අම්මා තනිවිය යුතුය. ඔවුන්ගේ කතාවන්ට සම්බන්ධ නොවී චතුමිණී රූපවාහිනිය බැලුවාය. ඒ රටේ, මේ රටේ, ඇමති නිවසේ විවිධ කතා කියද්දී කාලය ගතවෙනවා ඔවුනට දැනුණෝ නැත.

අංජනාට ඇමතුමක් ගන්නට බොහෝ වේලාවක පටන් තේනුක තෙන්නකෝන්ගේ හිතේ තිබුණි. හිතුවට වඩා වෙලාවද බොහෝ ගත වී රැයද ළඟා වුණෝය. ඒ මොහොතේ තේනුක සිටියේ අම්මාත්, සෙනුකා අක්කාත් සමඟ සඳැල්ලේ පුටු තබාගෙන කතා කරමිනි. ඒ සමාගමෙන් මොහොතක් ඔහු නැගිට ගියේ කමල් පහළ මිදුලේ සිට කතා කළ නිසාය.

**"අංජනා නෝනා කතා කළා. පුළුවන් නම් මහත්තයාට කෝල් එකක් ගන්න කිව්වා..."**

ඔහු උඩුමහලේ සඳැල්ලේ සිටියවුන්ට පෙනෙන සේ තේනුකගේ රතු කාරයේ බඳ අතගාමින් කීවේය.

**"මේගොල්ලො අද ඉන්නවා කිව්වද, යනවා කිව්වද කමල්..? ඉන්නවානම් අංජනාට රෑට ඉන්න පිළිවෙලක් කරන්න ඕනි..."**

ඇමති නිල නිවස මතක නැති ගාණට පරණ කතා අලුත් කතා කියවමින් ඉන්නා සෙනෙහෙලතා මැණිකේත් සොහොයුරියගේත් ඉතිරි පැය ගණනේ සැලසුම කමල් හෝ දන්නවාදැයි දැනගන්නට තේනුක බැලුවේය.

**"මට නම් මොකුත් කිව්වෙ නෑ මහත්තයා..."**

කමල් කාරය ළඟ සිටියදී තේනුක නිවසේ ඉදිරිපස දෙසට මදක් ඇවිද ගියේය. ඔහු පහත මහලේ පේමන්ට් එක වටේට මල් වවන්නට බැඳ තිබූ මදක් උස් වූ සිමෙන්ති බැම්මෙන් ඉඳගත්තේය. අංජනා යෙහෙළියගේ නේවාසිකාගාර කාමරයට ඇරලවා විත් පැය හතරකටත් වඩා ගෙවෙන්නට ඇත. ඒ කාලය අතරතුර ඇයට ඇමතුමක් දෙන්නට නොලැබීම ගැන ඔහු පසුතැවුණෝය. සිමෙන්ති කුලුණට හේත්තු වී බිලූටූතය හරහා ඇගේ කටහඬ ඇසෙන තුරු ඔහු බලාසිටියේය.

**"ගෙදර ඇවිල්ලවත් කතා කළේ නැතුවට මං කමල්ට කතා කළේ..."**

අංජනාගේ සිහින් කටහඬේ වූයේ සමාව ඉල්ලන හැඟීමකි.

**"මොකද මේ බයෙන් වගේ කතා කරන්නේ නෝනා? හරි නම් මමයි ඔයාගෙන් සමාව ඉල්ලන්න ඕනි..."**

තේනුක තෙන්නකෝන් කීවේ ඇත්තටමය. මේ ගෙවුණු පැය තුන හතර අංජනා කොයිතරම් ලොකු චිත්ත පීඩාවකින් සිටින්නට ඇත්දැයි ඔහුට දැනෙන්නේ දැන්ය. ඇය අතරමගින් දමා ආ හැම දිනකම ගෙදරට හෝ සාප්පුවට ආ පසු ඇමතුමක් ලැබෙනතුරු ඇය බලා ඉන්නා බව ඔහු දනියි. ඒ ගැන අංජනා කියන්නේ ඔහු සුරක්ෂිතයි කියා හිතට තහවුරු කරගැනීමට කියාය.

**"ඇයි ඔයා සමාව ඉල්ලන්නේ..? මට වැරැද්දක් කළාද?"**

**"ඇයි නෝනා මෙච්චර දුරක් එක්කන් ඇවිත් අතරමගින් හලලා ආවට..."**

**"මං දන්නවා... ඔතෙන්ට මාව එක්ක එන්න පුළුවන් නම්... ඔයා මාව එක්ක එනවා කියලා."**

සොහොයුරිය ලංකාවට ආ පුවත දුරකතනයෙන් නොකියා ඉන්නට ඔහු තීරණය කළේ ඇමතුම ගනිද්දිමය. අංජනා නිවසට ආපසු ඒ බව කියන්නට ඔහු හිතාගත්තේය.

**"ඔතන අවුලක් නෑ නේද..?"**

ඇමතුම අවසන් කරන්නට හදද්දී ඔහුට මතක් වුණෝ එතැන තව හෝරාවක් දෙකක් ඉන්නට පසුබිමක් ඇත්දැයි දැනගැනුමටය.

**"අපෝ නෑ... මේ ජීවිතේ අපිට හුරුයිනේ... ඕනි නම් රෑත් ඉන්න පුළුවන් ඇඳුම් තියෙනවනම්..."**

අංජනා කීවේ විහිලුවට නොව ඇත්තටමය. විහිලුවකින්ම තේනුක ඇමතුම අවසන් කළේය. ඔහු තවත් මද වේලාවක් එහිම සිටියේය. ඒ හිතේ සන්සුන්කම සැනින් අවසන්ව ඔහු ගැස්සී ගියේ දෙවුරට දැනුණ දෑත් පහසෙනි. ඒ එක්කම හමා ආ විලවුන් සුවඳ කීවේ පැමිණ සිටින්නී සෙනුකා කියාය.

**"කවුද ඔයාගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් ද කතා කළේ?"**

තේනුක ඇයට දෙන්නට උත්තරයක් ගලපද්දී දකුණු පසින් කැරකී විත් ඇය ඔහු ළඟම සිමෙන්ති බැම්මෙන් ඉඳගත්තාය.

ලබන සතියට

උගස් තැබූ
රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ
බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහල මිලක්
076 101 88 53
SL PROMO


ඔබ දෛවයට පිටුපායිද.. ?
දෛවය ඔබට පිටුපායිද.. ?
● ජීවිතයේ අතීත සහ වර්තමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
● වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.
හස්ත රේඛා විශේෂඥ
එස්. කෝරළේගේ
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,
සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.


සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා









# අපි බම්බු ගහමු!

"බම්බු ගහපිය."

වාක්‍ය කියෝපු හැටියේ ටිකක් කලබල වුණා නේද? කලබල වෙන්න කාරි නැහැ. අසූ තුන් හාරදහට විතර කේන්ති ගියාපු වෙලාවට කාගේ කාගෙත් කටින් පනින වචනයක් නොවෑ ඕක.

හැම එකටම බම්බු කතා කියන්න කටවල් ඉස්සර කරගත්තට මොකදෑ ගොඩක් උදවිය ඔය කියමන පිටිපස්සේ තියෙන කතාව දන්නේ නැහැ.

දැන් වගේ නෙමේ ඉස්සර අපේ මිනිස්සුන්ට ගවයින් එක්කලා ලොකු සම්බන්ධතාවයක් තිබුණා. කරත්තේ බඳින්න, කිරි, ගොම ගන්න, කුඹුරු පාගන්ට ඔය හැම වැඩේටම හිටියේ ගව සම්පත. ඔහොම ඉන්දැද්දි ඉතින් ගවයින්ට බඩේ අජීර්ණ කාරිය එහෙමත් හැදෙනවලු. එතකොට ගැමියෝ උණ ගහකින් පුරුකක් කපලා ඒක ගවයගේ උගුරට බස්සලා අජීර්ණ ගුලි පොවනවලු. ඒ කාලේ උදවිය බම්බු ගහනවා කිව්වේ ඕකට. බම්බු ගහන්නේ වඩි තුනලු. සතා සුවලු. ඉතින් ඒ කාලේ කවුරුහරි මෝඩ වැඩක් කරාපුවහම ඒ පුද්ගලයාව ගවයට සමාන කරන්න "මූට බම්බු ගහපිය" කියලා කියනවලු.

ඔය වගක් නොදැන වුණත් දැන් කාලෙත් ඔය බම්බු ගහන කතාව හරියට පාවිච්චි කරනවා. "ලෝකෙට බම්බු ගහගන්න කියලා ජීවිතේ විඳින්න" කියලා ෆේස්බුක් එකේ එහෙමත් ශෙයා වෙනවා. ඒත් ඉතින් ලෝකෙට බම්බු ගහගන්න කියලා ජීවිතේ විඳින්නේ කොහොමද මේ තියෙන ආර්ථිකේ එක්ක කියලා කෙනෙකුට හිතෙන්න පුළුවන්.

ඒකටත් විසඳුමක් තියෙනවා. ආර්ථිකේටත් බම්බු ගහගන්න කියලා ජීවිතේ විඳින්න තරමට පෝසත් වෙන්නනම් බම්බු හිටවන්න. ඒ කොහොමද කියලයි දැන් අපි කියලා දෙන්නේ.

ගෘහස්ථ ශාකයක් විදියට ලෝකේ වැඩිපුරම අලෙවි වෙන ශාකයක් තමයි ලකී බැම්බෝ නැත්තම් සැන්ඩ්‍රියානා කියන්නේ. අපේ රටෙත් මේ වාසනාවන්ත උණ ගස්වලට තියෙන ඉල්ලුමේ අඩුවක් නැහැ.

මීට අවුරුදු 6000කට කලින් පුරාතණ චීන ජාතිකයෝ සූර්ය කිරණ සහ සුළං සමබර කරගෙන වාසනාව උදාකරගන්න පුළුවන් ෆෙන්ශුයි කියලා ක්‍රමවේදයක් හොයාගත්තා. ඉතින් චීන ජාතිකයෝ කියන විදියට ලකී බැම්බෝ කියන්නේ ෆෙන්ශුයිවල සංකේතයක්.

ගෙදරක නැත්තම් ව්‍යාපාරික තැනක ලකී බැම්බෝ පැළයක් තියාපුවහම එතැනට ධනය, වාසනාව ආකර්ෂණ වෙලා කිරියි පැණියි උතුරනවලු.

ලකී බැම්බෝ ගහ වාස්තු විද්‍යාවට අයත් එකක් කියලයි ඉන්දියානුවෝ නම් කියන්නේ. රාමායණයට අනුව සීතා දේවිට ඇඟිලි හයක් තිබුණාලු. පස්සේ මෙයින් එක ඇඟිල්ලක් කැපිලා. සීතා දේවී ඒ ඇඟිල්ල අරන් පොළවේ වැළලුවහම එතැනින් ලකී බැම්බෝ පැළයක් මතුවුණාලු. ක්‍රිෂ්ණා දෙවියන්ගේ බටනලාව හදලා තියෙන්නෙත් මේ උණ වර්ගයෙන් කියලයි ඉන්දියානුවෝ කියන්නේ. ඔය කතා කොහොම වෙතත් මේ ශාකයේ ලොකු ශක්තියක් තියෙනවා කියලා දැන් යුරෝපීයයන් පවා විශ්වාස කරනවා.

ගියපු වෙලාවක නිකමට බලන්න අපේ රටේ ලොකු ලොකු ශොපින් මෝල්වල පවා මේ ලකී බැම්බෝ බර ගණන්වලට විකුණනවා. මොකද ගෙවතු අලංකරණයට විතරක් නෙමෙයි ව්‍යාපාරික ස්ථාන අලංකාර කරන්නත් බහුතරයක් දෙනා ලකී බැම්බෝ මිලදී ගන්නවානේ. නෑ හිතවතුන්ට තෑගි දෙන්නත් පංකාදු නිසා මේව්වට හොඳ ඉල්ලුමක් හදාගන්න අමාරු නැහැ.

හරි, කතා නවත්තලා වැඩේ පටන්ගමු. ලකී බැම්බෝ කියන්නේ හරි හයිය ගහක්. කොච්චර නැමුවත් ගහ කැඩෙන්නේ නැහැ. ශාකය නම්‍යශීලී නිසා අපිට අවශ්‍ය විදියට ලස්සන නිර්මාණ කරගන්න පුළුවන්. ලකී බැම්බෝ ශාකයේ එක එක කුල තියෙනවා. ගෙවල්වල නිර්මාණ විදියට තියන්න ගොඩක්ම යොදාගන්නේ ඩ්‍රෙසීනා සැන්ඩ්‍රියානා කුලේ ශාක. පැළ තවාන්වලින් වගා කළ ශාක දඬු මිලදී ගන්න. ඒවා පෝච්චිවල වගා කරලා අතු ලබාගන්න පුළුවන්. මේ ශාකයට වැඩිපුර ජලය, පොහොර යොදන්න අවශ්‍ය නැහැ. එව්වා නොදැම්මත් ගස සාරවත්ව හැදෙනවා. හැබැයි වැඩිය අව්වේ තියන්න නම් එපා.

එහෙම හිටවගන්න බම්බු ශාකවලින් දිග, මහත අඩු නම්‍යශීලී ඍජු අතු ටිකක් තෝරගන්න. වැඩේට තෝරගත්ත අතුවල පත්‍ර කඳ වටේ සර්පිලාකාරව තියෙන්න ඕනේ. ලප, පිළිස්සුම් පැල්ලම් නැති ශාක අතු තෝරගන්න එකත් වැදගත්. උණ අතුවලට අමතරව මේ දේවල් ටිකත් සපයාගන්න.

ලකී බැම්බෝ හිටවන්න ඒකට ගැළපෙන සෙරමික් නැත්නම් මැටි පෝච්චියක්, වගා මාධ්‍ය විදියට සාරවත් පස් ටිකක්. හවායන් ටේප්, ගෝනි නූල්, කම්බි රාමු, මැක්‍රම් වළලු හෝ මැක්‍රම් සැකිලි, කතුරක්, දිලීර නාශකයක් අවශ්‍ය වෙනවා.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

## ගෙතූ නිර්මාණ සැකසීමට







**පියවර 1**

නිර්මාණයට ගන්න අතුවල අග්‍රස්ථයේ තියෙන පත්‍ර විතරක් ඉතිරි කරලා අනෙක්වා සම්පූර්ණයෙන්ම අයින් කරන්න.

**පියවර 2**

අතු කොටස් සැකිල්ලට කම්බි රාමුවලට නැත්නම් මැක්‍රම් වළලුවලට තියලා අවශ්‍ය හැඩය එන විදියට ටේප්වලින් ගැටගහන්න. අන්තිමට හදාගත්තු බම්බු නිර්මාණය විනාඩි 5ක් විතර දිලීර නාශකයක බස්සවලා තියලා භාවිතා කරන බඳුනේ වගා මාධ්‍ය පුරවලා ශාකය හිටවලා සෙවනකින් තියන්න.

**සර්පිලාකාර නිර්මාණවලට**

ලකී බැම්බු අත්තක් පෝච්චියක හිටවන්න. කාඩ්බෝඩ් පෙට්ටියක පැත්තක සිදුරක් හදලා සතියකට වතාවක් මේ පෙට්ටිය ටිකක් කරකවන්න. එතකොට පෙට්ටියේ සිදුරෙන් ලැබෙන ආලෝකයට කඳ හැරෙන නිසා සර්පිලාකාර අතු ලබාගන්න පුළුවන්.

සාමාන්‍ය මෙහෙම හදාගන්න ලකී බැම්බු ගස් රුපියල් 600 ඉඳලා මිල කරන්න පුළුවන්. අවශ්‍ය නම් 0714766819 අංකයෙන් වැඩිපුර විස්තර අහගන්නත් පුළුවන්.





කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.